# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,679 – 2010 නොවැම්බර් මස 04 වැනි බ්‍රහස්පතින්දා – 2010.11.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

## තනතුරු - ඇබෑර්තු

### අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
### සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු ඇබෑර්තු

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියළුම අයදුම්පත් මෙයට යාකර ඇති ආදර්ශ ආකෘතිය අනුව සකස් කර ''අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අංක : 36, මලලසේකර මාවත, කොළඹ 07'' යන ලිපිනයට 2010.11.26 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු ය.

01. *වැටුප් ක්‍රමය :*
   - 01:1 මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය; රු. 28,095 - 5 x 645 - 5 x 750 - රු. 35,270 (වැටුප් කේතය - එස් එල් 5)

02. *සුදුසුකම් :*
   සෑම අයදුම්කරුවෙකුම :
   - 02:1 විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.
   - 02:2 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
   - 02:3 2010.11.26 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
   - 02:4 අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු විය යුතු ය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*
   - 03:1 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

04. *සේවා කොන්දේසි :*
   - 04:1 තනතුරට පත්වූ දින සිට වසර තුනක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය. (1 පරිශිෂ්ඨයෙහි දැක්වේ.)
   - 04:2 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වන අතර වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
   - 04:3 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසිවලට ද මෙම කොමිෂන් සභා නියෝගවලට ද රජය විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු ය.
   - 04:4 පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. දැනට රජයේ ස්ථිර තනතුරක් දරන්නෙකු තෝරා පත් කර ගනු ලැබුවහොත් ඔහු හෝ ඇය එක් අවුරුද්දක පරීක්ෂණ කාලයකට යටත්ව පත් කරනු ලැබේ.
   - 04:5 බඳවා ගනු ලබන නිලධාරින් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවක් සේවයට බැඳී වසර පහක් තුළ ලබා ගත යුතු ය.

05. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතු ය.

06. දැනුම් දීමක් කළ විට අයදුම්කරුවන් පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත්‍රයට කිසිදු සහතිකයක් අමුනා නොඑවිය යුතු ය.
   - (i). අධ්‍යාපන සහතික
   - (ii). උප්පැන්න සහතිකය
   - (iii). ජාතික හැඳුනුම්පත
   - (iv). පළපුරුද්ද පිළිබඳ සහතික (අධිකරණ නිලධාරියෙකු හෝ අවම වශයෙන් වසර 10 කට නොඅඩු වෘත්තීය පළපුරුද්ද ඇති නීතිඥවරයෙකු විසින් නිකුත් කරන ලද සහතිකවලින් සනාථ විය යුතුය.)
   - (v). චරිත සහතික දෙකක් (මින් එකක් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් විය යුතු ය.)

   අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. මෙම දැන්වීමේ අවශ්‍යතාවන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලක්ෂ්මී ජයවික්‍රම,
අධ්‍යක්ෂ ජනරාල්,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව.

2010 ඔක්තෝබර් මස 25 වැනි දින,
අංක 36, මලලසේකර මාවත,
කොළඹ 07,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව***

*සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු*

01. (i) මුලකුරු සමග නම :————. මහතා/මිය./මෙනවිය
    (ii) සම්පූර්ණ නම :————. මහතා/මිය./මෙනවිය
02. ලිපිනය :
    (i) පෞද්ගලික ලිපිනය :————.
    (ii) රාජකාරි ලිපිනය :————.
    (*රාජ්‍ය සේවයේ නියුක්ත නම්*)
03. (i) උපන් දිනය :————.
    අවුරුද්ද :———., මාසය :———., දිනය :———.
    (ii) 2010.11.26 වැනි දිනට වයස : අවු :———., මාස :———., දින :———.
04. ජාතික හැඳුනුම්පත් අංකය :————.
05. ජන වර්ගය :————.
06. ස්ත්‍රී / පුරුෂ භාවය :————.
07. (i) අධ්‍යාපන සුදුසුකම් :————.
    (ii) වෘත්තීය සුදුසුකම් :————.
    2010.11.26 දිනට වෘත්තීය පළපුරුද්ද : අවු :———., මාස :———., දින :———.
08. රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූ හෝ ධූරය හැරගිය අයෙකු ලෙස සළකනු ලැබූ කෙනෙක් ද යන වග :————.
09. (i) කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ ද ? :———.
    (ii) පිළිතුරු 'ඔව්' නම් ඒ පිළිබඳ විස්තර :————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා නුසුදුස්සකු වීමට හේතු වන බවත් පත් කිරීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්,

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

............................ මයා. / මිය. / මෙනවිය, මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත් ඔහු / ඇය මෙම තනතුරු සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහුව / ඇයව සේවයෙන් නිදහස් කළ හැකිය / නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
දෙපාර්තමේන්තුව :————.

(නිල මුද්‍රාව සහිතව)

පරිශිෂ්ඨය 1

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නිර්දේශ පත්‍රය

කාර්යක්ෂමතා කඩඉම් විභාගය ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි ඇතුළත් පැය තුනක ප්‍රශ්න පත්‍රයකි.

1. ආයතන සංග්‍රහය : II, VII, XII, XIII, XVI, XXVIII, XXX, XLVII, XLVIII පරිච්ඡේද
2. මුදල් රෙගුලාසි : I, II, III, IV, V, VI, VII, VIII, IX, X, XI, XII, XIII, XIV පරිච්ඡේද
3. දෙපාර්තමේන්තු රෙගුලාසි : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂමට අදාළ චක්‍රලේඛ උපදෙස් හා රෙගුලාසි

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගත යුතු වේ.

11-169

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### යෞවන කටයුතු අමාත්‍යාංශය

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරින් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009 (2010)

යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ පවත්නා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සේවය කරනු ලබන ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරින්ගේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම සඳහා විභාගයක් මෙම අමාත්‍යාංශය වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලැබේ. පහත සඳහන් නිවේදනයට අනුකූලව ඒ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාග පටිපාටිය :*
   - (අ) මෙම විභාගය ප්‍රශ්න පත්‍ර හතරකින් යුක්ත වන අතර එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශ පහත සඳහන් වේ.
   - (ආ) 01 සිට 03 දක්වා විෂයයන් සඳහා මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 100ක් බැගින් වන අතර, එක් එක් විෂයයන් සමත්වීමේ අවම ලකුණු ප්‍රමාණය 40 බැගින් වේ.
   - (ඇ) මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.
   - (ඈ) ඉංග්‍රීසි විෂයයට අදාල ලිඛිත පරීක්ෂණයේ ලකුණු 75න් 30 ක් ද වාචික පරීක්ෂණයෙන් ලකුණු 25න් 10 ක් ද ලබාගැනීම අවශ්‍ය වේ.
   - (ඉ) මෙම විභාගයට නියමිත විෂයන් 04, එක් වතාවකදී හෝ කිහිප වතාවකදී හෝ පෙනී සිටිය හැකිය.

03. *ප්‍රශ්න පත්‍ර සහ එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාල විෂය නිර්දේශ :*

**පළමුවන ප්‍රශ්න පත්‍රය (කාලය පැය 03යි)**

I මුදල් රෙගුලාසි - (විෂය අංකය - 01) ;
- (i) ඒකාබද්ධ අරමුදල
- (ii) අයවැය වර්ගීකරන ඒකකය
- (iii) පුනරාවර්තන වියදම්, ප්‍රාග්ධන වියදම්
- (iv) වීරමෝං ක්‍රියාපටිපාටිය
- (v) ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්ගේ අධීක්ෂණය
- (vi) ගණන්දීමේ නිලධාරීන් හා රාජ්‍ය ආදායම් පිළිබඳ ගණන් දීමේ නිලධාරීන්
- (vii) ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම්
- (viii) රාජ්‍ය ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරින්ගේ යුතුකම් හා වගකීම්
- (ix) භාණ්ඩාගාර අධීක්ෂණය හා පාලනය
- (x) දෙපාර්තමේන්තුවක් වශයෙන් භාණ්ඩාගාරය සතු විධායක කාර්යයන්
- (xi) අභ්‍යන්තර විගණනය
- (xii) මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරාදීම (අ. වියදම් ආ. ආදායම)
- (xiii) විගණන විමසුම්
- (xiv) ගෙවීම් කාර්ය පටිපාටිය
- (xv) සමීක්ෂණ මණ්ඩල
- (xvi) සැපයුම් හා සේවා ලබා ගැනීම පිළිබඳ කාර්ය පටිපාටිය
- (xvii) අත්තිකාරම්

***දෙවැනි ප්‍රශ්න පත්‍රය (කාලය පැය 03 යි)***

II ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම - (විෂය අංකය - 02)
ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩය හා II වන කාණ්ඩයෙහි කරුණු පිළිබඳව හා කාර්යාල ක්‍රම සහ ක්ෂේත්‍ර සංවිධාන ක්‍රම පිළිබඳ දැනුම විමසා බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

***තුන්වැනි ප්‍රශ්න පත්‍රය (කාලය පැය 03යි)***

II නීතිය හා කළමනාකරණය - (විෂය අංකය - 03)

නීතිය :
- නීතිය පිළිබඳ නිර්වචනය
- ශ්‍රී ලංකාවේ නීති පද්ධති
- ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධති
- සමාගම් ලියාපදිංචිය
- ව්‍යාපාර නාම ලියාපදිංචිය
- පේටන්ට් බලපත්‍ර
- ආදායම් බදු
- කම්කරු නීතිරීති
- පාරිසරික නීති
- පාරිභෝගික ආරක්ෂක පනත
- සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල
- පළාත් පාලන ආයතන මගින් පනවන නීතිරීති

කළමනාකරණය :
- කළමනාකරණය පිළිබඳ හැඳින්වීම
- කළමනාකරුවන්ගේ කාර්යයන් හා දක්ෂතා
- සැලසුම් ක්‍රියාවලිය හා සංවිධාන මට්ටම් ඇති කිරීම
- සංවිධාන ව්‍යුහය
- කාර්ය සාධනය ඇගයීම
- අභිප්‍රේරණය
- නායකත්වය
- සන්නිවේදනය
- තීරණ ගැනීම
- ඵලදායීතාව සහ ඵලදායීතා කව
- කළමනාකරණ ආචාර ධර්ම හා වගකීම
- බැංකු ක්‍රම
- රක්ෂණය

(ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව සාමාන්‍ය අවබෝධය මැන බැලීම සඳහා සකස් කරන ප්‍රශ්න පත්‍රයකි.)

***හතරවැනි ප්‍රශ්න පත්‍රය (කාලය පැය 03යි)***

(iv) ඉංග්‍රීසි - (විෂය අංකය - 04)
- (අ) ලිඛිත පරීක්ෂණය
- (ආ) වාචික පරීක්ෂණය

(I) Content

Written Examination (3 hours).

(*a*) Grammer : The following areas will be tested :-
- (1) The Verb Forms of all Principal tenses, of English *eg*. The Present Simpale Tense, The simple past, The Future, The Present Perfect, Etc.
- (2) Nouns, Countable, Uncountable
- (3) Pronouns
- (4) Adjectives Degrees, of Comparision.
- (5) Adverbs of Frequency, Word order, phrases and sentences.
- (6) Prepositions
- (7) Determiners
- (8) Question Words
- (9) Model Auxilaries, Can, Could, May, Might, Should, Must, Ought.
- (10) The Definite Article
- (11) Cardinals / Ordinals
- (12) The Passive Consruction
- (13) Relative Clauses
- (14) If Clauses
- (15) Reported Speech
- (16) There is / There are
- (17) Have / Has

(*b*) Vocabulary tested will be that of Generl Modern English with special emphasis on the following field of management Administration and Social and Economic Development

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 නොවැම්බර් මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ඔක්තෝබර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

---


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

(*c*) Writing - Ability to write Essays, Departmental Reports, Official Letters
Oral Examination (15 minutes)
(a) Speech
(b) Listening Comprehention
(c) Reading
(2) Scheme of Examination
(1) Written examination - There will be one paper of 3 hrs. duration. (75% Marks)
(2) Oral Examination - 15 Minutes duration (25% Marks)

04. ඉල්ලුම් කිරීමේ ක්‍රමය

(*අ*) මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව ඉල්ලුම් පත්‍රය ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ සකස් කර ගත යුතුය. ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක (1) සිට (3) තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය 2 වැනි පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු ය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතු වන අතර, එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

(*ආ*) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් 2010.12.06 දිනට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට එවිය යුතු ය. :-

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
(සංවිධාන හා විදේශ විභාග ශාඛාව)
පැලවත්ත,
බත්තරමුල්ල.

(*ඇ*) ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයේ ඉහළ වමත් පස "ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරින්ගේ පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයට පසුව ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් භාර ගනු නොලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(*ඈ*) ඉල්ලුම් පත්‍ර ලැබුණු බවට අයදුම්කරුවන්ට දන්වනු නොලැබේ. අයදුම්කරුවන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම විභාග කොමසාරිස් ජනරාල් විසින් පුවත්පත් මඟින් ඒ බව නිවේදනය කරනු ලැබේ. එවැනි නිවේදනයක් පිළිබඳව විමසිල්ලෙන් සිටීම වැදගත් වේ. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබා ගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත. (විදුලි පණිවුඩ සඳහා ලිපිනය "විභාග" පැලවත්ත, බත්තරමුල්ල වේ.)

05. *විභාගයට පෙනී සිටීම* :

(*අ*) ඉල්ලුම්පත් එවා ඇති සියලුම අපේක්ෂකයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග ශාලාධිපතිට, අත්සන සහතික කරවා ගත් තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාග අපේක්ෂකයින් අනුගමනය කළ යුතු රීති මාලාවක් *ගැසට්* නිවේදනයේ ඇතුළත්කර ඇත. සටහන :- අපේක්ෂයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර තිබීම විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(*ආ*) අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :- තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතාව පත්‍රවලින් එකක් පමණක් පිළිගනු ඇත.

(i) ජාතික හැඳුනුම්පත :————.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය :————.

————,

සු. සෝ. හේවාපතිරන,
ලේකම්,
යෞවන කටයුතු අමාත්‍යාංශය.

කොළඹ 05, ඇල්විටිගල මාවතේ,
354/2, "නිපුනතා පියස" යෞවන කටයුතු අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය** [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

යෞවන කටයුතු අමාත්‍යාංශයේ, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ව්‍යවසායකත්ව සංවර්ධන
පුහුණු නිලධාරින් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009 (2010)

1st Efficiency Bar Examination For Entrepreneurship Development Training Officers - 2009 (2010)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :-
සිංහල - 2/දෙමළ - 3 [ ]

(අදාල අංකය කොටුව තුළ ලියන්න.)

01. නම :
1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
උදාහරණ : SILVA, G.A.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්)
1.4 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]
1..5 ස්ත්‍රී / පුරුෂ භාවය :————. [ ]
(ස්ත්‍රී - 1 පුරුෂ - 0) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. 2.1 රාජකාරි ලිපිනය :————.
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)*
*(මෙම ලිපිනයට ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.)*
2.2 ස්ථිර ලිපිනය :————.
*(සිංහලෙන්)*

03. විභාගයට පෙනී සිටින විෂයන්

1. .................................. එම විෂය අංකය [ ]
2. .................................. එම විෂය අංකය [ ]
3. .................................. එම විෂය අංකය [ ]
4. .................................. එම විෂය අංකය [ ]

ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

***ආයතන ප්‍රධානියාගේ සහතිකය***

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන .................................. මයා / මිය /මෙනවිය, මා ඉදිරියේදී අත්සන් තැබූ බව ද ඔහු / ඇය විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව ද අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බව ද සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
ලිපිනය :————.

11-132

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**
**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**
**පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ කැෆටේරියා ආපන ශාලාව පවත්වාගෙන යාම**
2010 - 2011 වර්ෂය

01. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය තුළ පිහිටි කැෆටේරියා ආපනශාලාව 2010-2011 වර්ෂයක කාල සීමාවක් තුළ පවත්වාගෙන යාම සඳහා සුදුසු ලංසු කරුවෙකු තෝරාගැනීම පිණිස සුදුසුකම්ලත් සහ හැකියාවන්ගෙන් යුත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලැබේ.

02. ලංසුපත් භාර ගැනීමේ අවසාන දිනය 2010 නොවැම්බර් මස 26 වැනි දින වන අතර අවසාන වේලාව එදින පෙරවරු 10.00 වේ. ලංසුපත් භාර ගැනීම අවසාන වූ වහාම ලංසුපත් විවෘත කිරීම සිදු කරනු ලැබේ. ඒ සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

03. ලංසු ආකෘති කොන්දේසි හා අනිකුත් විස්තර පේරාදෙණිය, අංක 1094, සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ, පිහිටි ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් 2010 නොවැම්බර් මස 24 වැනි දින දක්වා කාර්යාල වේලාවන් තුළ ලබාගත හැකිය. ඒ සඳහා ලංසු අයදුම්කරුවන් විසින් රු. 5,000 ක ආපසු නොගෙවන තැන්පතු මුදලක් ගෙවා ලබා ගන්නා පොදු 172 රිසිට්පතක් ඉදිරිපත් කළ යුතු වේ.

04. ලංසුපත් අයදුම්කරුවන් වෙත ලංසු ඉදිරිපත් කිරීම සඳහා ආකෘතිපත්‍ර පිටපත් දෙකක් ලබාදෙනු ලැබේ. ඒවා සම්පූර්ණ කර මුල්පිටපත හා අනුපිටපත යනුවෙන් සඳහන් කර කවර දෙකක බහා ඉදිරිපත් කළ යුතු ය. එම කවරවල විවෘත කළ හැකි ස්ථානවල සීල් තබා හෝ රබර් මුද්‍රාව යොදා එවීම අනිවාර්යය වේ. එමෙන් ම කවරයේ වම්පස ඉහළ කෙලවරේ "කැෆටේරියා ආපනශාලාව පවත්වාගෙන යාම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

05. ලංසුපත් සභාපති, මහා පරිමාණ ප්‍රසම්පාදන මණ්ඩලය, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, තැ. පෙ. 14, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එසේ නැත්නම් අතින් ගෙනවිත් දෙපාර්තමේන්තුවේ ඇති ලංසුපත් බහාලන පෙට්ටියට බහාලිය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ලංසු ලියවිලි සමග රු. 2,00,000 වටිනා දින 90 කට වලංගු ඇප බැඳුම්කරයක් පිළිගත් බැංකුවකින් හෝ රක්ෂණ ආයතනයකින් ලබාගෙන ඉදිරිපත් කළ යුතු ය.

07. සුදුසු ලංසුකරුවෙකු තෝරාගැනීම පිළිබඳව සම්පූර්ණ අයිතිය දෙපාර්තමේන්තු මහා පරිමාණ ප්‍රසම්පාදන මණ්ඩලය සතු වේ. ඒ සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම තෝරා ගැනීම සඳහා නුසුදුසුකමක් ලෙස සළකනු ලැබේ. එමෙන් ම ඉහත නිවේදනයේ හෝ ලංසුපත්වල සඳහන් නොවන කිසියම් කරුණක් පිළිබඳව අවසාන තීරණයක් ගැනීමේ සම්පූර්ණ අයිතිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන දෙපාර්තමේන්තු මහා පරිමාණ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති සතු වේ. මේ පිළිබඳව වැඩිමනත් විස්තර අවශ්‍ය වන්නේ නම් 081- 2388654 දුරකථනය මගින් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (මුදල්) ඇමතීමෙන් ලබාගත හැකිය.

ආචාර්ය ඩී. එස්. ඒ. විජේසුන්දර,
අධ්‍යක්ෂ ජනරාල්,
සභාපති,
දෙපාර්තමේන්තු මහා පරිමාණ ප්‍රසම්පාදන මණ්ඩලය,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව.

2010 ඔක්තෝබර් මස 20 වැනි දින.
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

11-82

## බඩු බාහිරාදිය විකිණීම

**පොලිස් දෙපාර්තමේන්තුව - නිකවැරටිය කොට්ඨාසය**
පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසිය

පොලිස් දෙපාර්තමේන්තුවේ නිකවැරටිය පොලිස් කොට්ඨාසයට අයත් පොලිස් ස්ථානවල පාවිච්චි කර ගර්හිත කරන ලද පාවිච්චියට ගත නොහැකි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 2010 නොවැම්බර් මස 12 වැනි දින පැය 0900 ට නිකවැරටිය පොලිස් ස්ථාන පරිශ්‍රයේ දී පැවැත්වේ.

2010 නොවැම්බර් මස 11 වැනි දින පැය 1300 සිට පැය 1600 දක්වා අදාළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

වෙන්දේසි භූමියට ඇතුළුවන සියලුම තරාතිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුයි.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේ ම මුදල් ගෙවා ලදුපත් ලබාගත යුතු යි. වෙනත් ගෙවුම් ක්‍රම භාවිතා නොකෙරේ. (චෙක්පත් හෝ ක්‍රෙඩිට් කාඩ්)

වෙන්දේසියෙන් මිල දී ගනු ලැබූ භාණ්ඩ 2010 නොවැම්බර් මස 12 දින පැය 1600 ට පෙර අදාළ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතු යි. එසේ ඉවත් කර නොගන්නා භාණ්ඩ පිළිබඳව වග කියනු නොලැබේ.

වෙන්දේසියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම, ඇවර කිරීම සහ විශේෂ හේතුවක් මත වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කිරීම යන තීරණ වෙන්දේසි මණ්ඩලය විසින් ගනු ලැබේ.

වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි,
නිකවැරටිය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *භාණ්ඩය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 01. | බාල්දි කුඩා | 02 |
| 02. | විදුලි පන්දම් | 01 |
| 03. | බැටරි වොල්ට් 12 | 05 |
| 04. | ලන්තෑරුම් | 01 |
| 05. | අත් මුල්ලු | 04 |
| 06. | ඇළුමිනියම් මුට්ටි | 01 |
| 07. | ඇඳන් යුගල | 36 |
| 08. | ඇඳන් තනි | 22 |
| 09. | ඇළුමිනියම් කේතල | 01 |
| 10. | අල්මාරි-වානේ | 02 |
| 11. | ඉබි යතුරු කුඩා | 08 |
| 12. | ඉබි යතුරු 1 1/4 | 03 |
| 13. | ඉබි යතුරු 2 | 12 |
| 14. | ඉබි යතුරු 2 1/2 | 04 |
| 15. | ඉබි යතුරු | 04 |
| 16. | ඉබි යතුරු 1 | 01 |
| 17. | ඉබි යතුරු 1 1/2 | 06 |
| 18. | උදලු තල | 09 |
| 19. | කල්දේරම්-ලොකු | 03 |
| 20. | කල්දේරම්-පොඩි | 01 |
| 21. | කම්පියුටර් | 02 |
| 22. | කොන්ඩ් පට්ටම් | 01 |
| 23. | පොරෝ තල | 01 |
| 24. | යකඩ පුටු | 10 |
| 25. | වානේ කුඩා පුටු | 42 |
| 26. | රෙක්ෂින් පුටු | 08 |
| 27. | පයිප්ප පුටු | 20 |
| 28. | බාල්දි ලොකු | 02 |
| 29. | බාල්දි කුඩා | 04 |
| 30. | මල්ටි පොට් | 03 |
| 31. | මේස පිහියා | 02 |
| 32. | මොනිටර් | 02 |
| 33. | යතුරු ලියන (ඉංග්‍රීසි) | 02 |
| 34. | යතුරු ලියන (සිංහල) | 10 |
| 35. | යතුරු තහඩු | 03 |
| 36. | රූපවාහිනී -වර්ණ | 02 |
| 37. | රේඩියෝ | 01 |
| 38. | රේක්ක | 04 |
| 39. | රේඩියෝ කැසට් | 03 |
| 40. | විදුලි කේතල | 09 |
| 41. | විසි කැති-දිරාගිය | 04 |
| 42. | මේස විදුලි පංකා | 09 |
| 43. | විදුලි පන්දම් | 01 |
| 44. | වතුර පිල්ටර් | 09 |
| 45. | වතුර බොයිලේරු | 02 |
| 46. | වානේ කැබිනට් | 01 |
| 47. | සිවිලින් විදුලි පංකා | 10 |
| 48. | සාස්පාන් - මධ්‍යම | 06 |
| 49. | සාස්පාන් - කුඩා | 08 |
| 50. | පාපැදි | 08 |
| 51. | සිවිලින් පැන් රෙගියුලේටර් | 01 |
| 52. | සිවිලින් පැන් ස්විච් | 02 |
| 53. | හට්ටි -ඇළුමිනියම් | 04 |
| 54. | මේස හිරමන | 07 |
| 55. | අල්මාරි- වානේ | 01 |

11-48

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - කඩුවෙල**
අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබ රාජසන්තක කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ අවසන් වූ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත උපලේඛනයෙහි සඳහන් ද්‍රව්‍යයන් 2010.11.27 වැනි දින හා 2010.11.28 යන දිනයන්හි පෙ. ව. 10.00 ට කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහි පහත උපලේඛනයෙහි සඳහන් ද්‍රව්‍ය පිළිබඳ හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු යි.

3. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

4. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

5. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එදිනම මුදල් ගෙවා ප. ව. 4.00 ට පෙර එම භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු යි. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ. වෙන්දේසියට සහභාගිවීම සඳහා පැමිණෙන්නන් සිය ජාතික හැඳුනුම්පත ද ගෙන ආ යුතු යි.

සුජාතා අලහප්පෙරුම,
මහෙස්ත්‍රාත් කඩුවෙල.

2010 ඔක්තෝබර් මස 21 වැනි දින,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2010.11.27 වැනි දින වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ පිළිබඳ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | 3475 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | වට 3 ලිප් | 01 |
| 02. | 7580 | කහපාට කුඩා සිලින්ඩර් | 01 |
| 03. | 8710 | ගෑස් සිලින්ඩර් ගෑස් | 01 |
| | | ලිප් වට 4 | 01 |
| 04. | 13594 | ගෑස් සිලින්ඩර් | 02 |
| | | ගෑස් ලිප් | 01 |
| 05. | 17277 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 06. | 32778 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 07. | 34692 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 08. | 43722 | ලිප් | 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 09. | 47822 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 10. | 48711 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 11. | 48886 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 12. | 51314 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 13. | 55391 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 14. | 57111 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 15. | 61300 | ගෑස් සිලින්ඩර් | 01 |
| 16. | 15279 | වාහන බැටරි | 01 |
| 17. | 31706 | වාහන බැටරි | 01 |
| 18. | 62630 | වාහන බැටරි | 01 |
| 19. | 62504 | වාහන බැටරි | 03 |
| 20. | 12683 | වාහන බැටරි | 02 |
| 21. | 54527 | විවිධ ප්‍රමාණයේ යකඩ බට | 10 |
| 22. | 7653 | කැටපිලර් චේන් | 01 |
| | | කැබැල්ලක් (අඩි 07ක් පමණ දිග) | |
| | | යකඩ ප්ලේට් | 01 |
| 23. | 47042 | යකඩ ඉන්න (අඩි 3ක් 1/2 පමණ දිග) | |
| | | කුලුගෙඩි | 01 |
| 24. | 11403 | 20" x 20" ප්‍රමාණයේ යකඩ තහඩු | 08 |
| 25. | 6584 | භූමිතෙල් පරණ මැෂින් | 01 |
| 26. | 13424 | කළුගල් කැඩීමට ගන්නා හැමර් | 01 |
| 27. | 13475 | කොයිල් | 02 |
| | | පැන් පෙති | 01 |
| | | වෝල්ටනේටර් | 05 |
| | | ස්ටාටර් මෝටර් | 06 |
| 28. | 19393 | දිරාපත් වී ඇති වාහන සයිලන්සර්, | 01 |
| | | වාහන ආයුධ පෙට්ටි | 01 |
| | | වාහන හබ් | 02 |
| 29. | 34351 | ස්ටාටර් මෝටර් | 01 |
| 30. | 35403 | යතුරු පැදි | 02 |
| | | සොකට් සෝබර් | |
| 31. | 38406 | වෝල්ටර්නේටර් | 10 |
| 32. | 43231 | දිරාපත් වී ඇති යකඩ ගේට්ටු පියන් | 02 |
| 33. | 43254 | පෝක් ස්ප්‍රින් (ඩෝසරයක) | 01 |
| 34. | 48070 | ජෝ පලු | 02 |
| 35. | 50063 | ජෝ පලු | 01 |
| | | යකඩ කුට්ටි | 01 |
| 36. | 12283 | යකඩ බට විවිධ ප්‍රමාණයේ | 19 |
| 37. | 54264 | විවිධ ප්‍රමාණයේ ඇළුමිනියම් කැබලි | - |
| 38. | 60759 | යකඩ කම්බි රෝල් | 12 |
| 39. | 61172 | කාය වර්ධන උපකරණ කට්ටල | 01 |
| 40. | 5972 | කටර් අඬු | 01 |
| | | ඩීසල් ලීටර් 6 අඩංගු කෑන් | 02 |
| 41. | 49375 | එන්ජින් ඔයිල් ලීටර් 20 බැගින් | |
| | | අඩංගු කෑන් | 02 |
| 42. | 24322 | ඩීසල් ලීටර් 150 අඩංගු බැරල් | 02 |
| | | ඩීසල් ලීටර් 20 | |
| | | අඩංගු කෑන් | 01 |
| 43. | 13699 | යකඩ බට | 13 |
| 44. | 60068 | උදලු | 01 |
| 45. | 16170 | මුලු මට්ටම් | 01 |
| | | නියන් | 01 |
| | | ටේප් | 01 |
| | | කියත් | 01 |
| | | ඉස්කුරුප්පු නියන් | 02 |
| 46. | බී 7184 | දිරාපත් වි ඇති පා පැදි | 01 |
| 47. | 48956 | පා පැදිය | 01 |
| 48. | 63139 | පා පැදිය | 01 |
| 49. | 1253 | පාසැල් උපකරණ | - |
| | | (පැස්ටල් පෙට්ටි 02, කතුරු 02, චිත්‍ර පොත් 10, | |
| | | ක්ලේ පෙට්ටි 05) | |
| 50. | 11867 | පිරිමි අත්ඔරලෝසු | 01 |
| | | ග්ලූකෝ මීටරය | 01 |
| 51. | 28049 | රිවට්මැෂින් | 01 |
| | | මේස ඔරලෝසු | 01 |
| 52. | 43762 | බිත්ති ඔරලෝසු | 01 |
| 53. | 57375 | කුඩා විදුලි පංදම් | 01 |
| | | ඉකුරුප්පු නියන් | 01 |
| 54. | 58869 | බෝල මීටිය | 01 |
| 55. | 35636 | සීලර් ලීටර් 4 | 03 |
| | | ටින් | |
| 56. | 56232 | පිලර් කි. ග්‍රෑ. 28 බාස්කට් | 03 |
| 57. | 60908 | ටයිල් 11 බැගින් අඩංගු පෙට්ටි | 05 |
| 58. | | හිස් වීදුරු බෝතල් තොගයක් | |
| 59. | | හිස් කෑන් තොගයක් | |
| 60. | | නඩු කිහිපයකට අයත් කුලුගෙඩි | |
| | | තොගයක් | |
| 61. | | වැලි බාල්දි කිහිපයක් | |
| 62. | AR4041 | අංක සඳහන් නොමැති අබලන් තත්වයේ | |
| | | ඇති ත්‍රිරෝද රථය | 01 |
| 63. | 22192 | 15-7762 දරන ත්‍රිරෝද රථය | 01 |
| 64. | AR3736 | අංක 128-2573 දරන යතුරු පැදි | 01 |
| 65. | AR3276 | අංක 158-3885 දරන යතුරු පැදි | 01 |
| 66. | AR3651 | අංකඑච්. වයි. 6006 දරන යතුරු පැදි | 01 |
| 67. | බී 7341 | අංක 145-3879 දරන යතුරු පැදිය | 01 |
| 68. | AR4483 | අංක 103 -5970 දරන යතුරු පැදිය | 01 |
| 69. | 17671 | අංක 103 -1098 දරන යතුරු පැදිය | 01 |
| 70. | 55801 | අංක 142 -5748 දරන යතුරු පැදිය | 01 |
| 71. | 55946 | අංක 107 ශ්‍රී 6324 දරන යතුරු පැදිය | 01 |

**2010.11.28 වැනි දින වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 466 | වතුර මෝටරය | 01 |
| | | සිලින්ඩරය | 01 |
| | | විදුලි ස්ත්‍රික්කය | 01 |
| | | විදුලි පංකා | 01 |
| 02. | 42637 | කුඩා ගෑස් සිලින්ඩර | 01 |
| | | වතුර මෝටරය | 01 |
| 03. | 37247 | වතුර මෝටරය | 01 |
| 04. | 29617 | මෝටරය | 01 |
| 05. | 12188 | මන්නා පිහි | 01 |
| 06. | 13993 | පිහි | 01 |
| 07. | 22637 | මන්නා පිහි | 01 |
| 08. | 34376 | මන්නා පිහි | 01 |
| 09. | 53432 | මන්නා පිහි | 01 |
| 10. | 59294 | පිහි | 01 |
| 11. | 58460 | පිහි | 01 |
| 12. | 62127 | කැති | 01 |
| 13. | 62691 | මන්නා පිහි | 01 |
| 14. | 59927 | මන්නා පිහි | 01 |
| 15. | 34205 | තරාදි | 01 |
| 16. | 52111 | ජලනල උපාංග කිහිපයක් | - |
| 17. | 48704 | තටු ගලවා ඇති විදුලි පංකා | 01 |
| | | පිත්තල හුලං කොකු 24, ලීවර් අගුල් 24, | |
| | | සරනේරු 24 | |
| | | බර්ඩ් ලොක් 01, නිකල් කරාම 01, ඕවර් 01, වැල් 01 | |
| | | හා කොක් ටැප් 01 අඩංගු කවරය | |
| 18. | 52110 | ජලනල උපාංග අඩංගු කවරය | - |
| 19. | 52113 | ජලනල උපාංග අඩංගු කවරය | - |
| 20. | 58382 | පිත්තල සොයිබ 06, හුලං කොකු 17, ජනේල | |
| | | ලොක් 22 ක් අඩංගු කවරය | |
| 21. | 7437 | පිත්තල සරනේරු 05 ක් හා ස්කුරුප්පු | |
| | | නියනක් අඩංගු කවරය | |
| 22. | 35544 | බෆල් | 02 |
| 23. | 46352 | විදුලි ස්ත්‍රික්ක | 01 |
| | | රූපවාහිනී | 01 |
| 24. | 35099 | පියුස් එකක් සමග පියුස් බෝඩ් | 01 |
| 25. | 44609 | වාහන කැසට් 01 වාහන පැති කණ්නාඩි | |
| | | සහ මෙවලම් අඩංගු කවරය | 01 |
| 26. | 43787 | සී. ඩී. කැසට් ප්ලේයර් | 01 |
| 27. | 55348 | කැමරා | 01 |
| 28. | 6343 | කැසට් | 01 |
| 29. | 56377 | පරිගණක | 01 |
| 30. | 46399 | කැසට් රේඩියෝ | 01 |
| 31. | 142 | කැමරා | 01 |
| 32. | 44074 | කැමරා | 01 |
| 33. | 48827 | කැමරා | 01 |
| | | දුරදක්න | 01 |
| | | සෙල්ලං කාර් | 02 |
| 34. | AR4040 | සී. ඩී. ධාවන යන්ත්‍රය | 01 |
| | | වී. සී. ඩී. | 01 |
| | | රිදී පැහැති ඩෙක් යන්ත්‍රය | 01 |
| | | කුඩා කැසට් යන්ත්‍ර | 02 |
| 35. | 15830 | වී. සී. ඩී. යන්ත්‍රය | 01 |
| 36. | AR4107 | ලැප්ටොප් යන්ත්‍ර | 01 |
| 37. | AR4108 | ලැප්ටොප් යන්ත්‍ර | 01 |
| 38. | AR4260 | ඩී. වී. ඩී. ප්ලේයර් | 01 |
| 39. | AR4262 | ඩී. වී. ඩී. ප්ලේයර් | 01 |
| | | ඩී. වී. ඩී. ප්ලේයර් | 01 |
| | | ඩී. වී. ඩී. ප්ලේයර් | 01 |
| | | පරිගණක කොටස් | 01 |
| 40. | AR4245 | වාහන කැසට් | 01 |
| 41. | AR4283 | පා පැදි | 01 |
| | | ලැප්ටොප් පරිගනක | 01 |
| | | කැමරා | 01 |
| | | බූපර් | 01 |
| 42. | 19394 | නිමි ඇඳුම් අඩංගු කවරය (ටී ෂර්ට් | |
| | | කිහිපයක් හා කලිසමක්) | |
| | 44075 | බෆල් | 02 |
| 44. | 46676 | නිමි ඇඳුම් අඩංගු කවරය (කලිසම් | |
| | | කිහිපයක්) | |
| 45. | 21089 | නිමි ඇඳුම් අඩංගු කවරය (කලිසමක් හා | |
| | | ජර්සියක් හා ඇඳුම් මැසීමට ගන්නා | |
| | | රෙදි කැබලි 03) | - |
| 46. | 1519 | ජංගම දුරකථන | 01 |
| 47. | 44077 | ජංගම දුරකථන | 01 |
| 48. | 25628 | ජංගම දුරකථන | 01 |
| 49. | 59815 | කැමරාව | 01 |
| | | කැමරාව | 01 |
| | | ජංගම දුරකථන | 01 |
| 50. | 12067 | ජංගම දුරකථන | 01 |
| 51. | 57640 | ජංගම දුරකථන | 01 |
| 52. | 16842 | ජංගම දුරකථන | 01 |
| | | ජංගම දුරකථන | 01 |
| 53. | 24183 | ජංගම දුරකථන | 01 |
| 54. | 62145 | ජංගම දුරකථන | 01 |
| 55. | 53416 | ජංගම දුරකථන | 01 |
| 56. | 5109 | ජංගම දුරකථන | 01 |
| 57. | 1695 | ජංගම දුරකථන | 01 |
| 58. | 53695 | ජංගම දුරකථන | 01 |
| 59. | 4759 | ඇත් දළවලින් සාදන ලද ගෝලාකාර | |
| | | කොටස් | 02 |
| 60. | 56200 | ඉමිටේෂන් වළලු | 04 |
| 61. | 49831 | ඉමිටේෂන් කරමාලයක්, අත් පළඳනා 02, | |
| | | කරාබු ජෝඩු 02ක්, මුදු 02ක් | |
| 62. | 15687 | ඉමිටේෂන් වළලු 02 ක් අඩංගු මුද්‍රා බෝතලය | - |
| 63. | 42898 | රන් යැයි කියනු ලබන ග්‍රෑම් 06 යි මිලි | |
| | | ග්‍රෑම් 810 ක් අඩංගු යැයි කියන පිරිමි මුදුවක් | |
| | | අඩංගු මුද්‍රා බෝතලය | 01 |
| 64. | 53051 | රන් යැයි කියනු ලබන රන් මාල | |
| | | කැබැල්ල හා කුරුසයක් අඩංගු මුද්‍රා | |
| | | බෝතලය | 01 |
| 65. | 23623 | රන් යැයි කියනු ලබන කැඩුනු අත් | |
| | | මුද්‍රාවක්, කරාබු 01, ටසල් කරාබු 01ක් | |
| | | අඩංගු මුද්‍රා බෝතලය | 01 |
| 66. | 23937 | රන් යැයි කියනු ලබන පිරිමි මුදුවක් | |
| | | අඩංගු මුද්‍රා බෝතලය | 01 |
| 67. | AR4261 | රන් යැයි කියනු ලබන කැඩුනු | |
| | | මාලයක් අඩංගු මුද්‍රා බෝතලය | 01 |
| 68. | 15436 | රන් යැයි කියනු ලබන මිලි ග්‍රෑම් | |
| | | 95 ක් අඩංගු යැයි කියන කරාබු ජෝඩුවක් | |
| | | අඩංගු මුද්‍රා බෝතලය | 01 |
| 69. | AR3271 | රන් යැයි කියනු ලබන මාලයක් අඩංගු | |
| | | මුද්‍රා බෝතලය | 01 |
| 70 | AR3274 | රන් යැයි කියනු ලබන කාන්තා මුදුවක් | |
| | | අඩංගු මුද්‍රා බෝතලය | 01 |
| 71. | AR3273 | රන් යැයි කියනු ලබන ග්‍රෑම් 4යි | |
| | | මිලි ග්‍රෑම් 600 අඩංගු යැයි කියන මුදුවක් | |
| | | අඩංගු මුද්‍රා බෝතලය | 01 |
| 72. | 15440 | රන් යැයි කියනු ලබන ග්‍රෑම් 1යි | |
| | | මිලි ග්‍රෑම් 71 ක් අඩංග යැයි කියන රන් | |
| | | කැබැල්ලක් අඩංගු මුද්‍රා බෝතලය | 01 |
| 73. | 25897 | රන් යැයි කියනු ලබන පංචායුධයක් | |
| | | අඩංගු මුද්‍රා බෝතලය | 01 |
| 74. | 60072 | රන් යැයි කියනු ලබන මුදු | 01 |
| | | රන් යැයි කියනු ලබන චේන් කැබලි | 01 |
| | | 5" දිග සුර | 01 |
| | | තඹ සුර | 01 |
| | | රන් යැයි කියනු ලබන බෝල් හැඩ කරාබු | 01 |
| | | රන් යැයි කියනු ලබන කරාබුවක පිටුපස | |
| | | බෝල් 01ක් අඩංගු මුද්‍රා බෝතලය | 01 |

11-131

---

**දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - පැල්මඩුල්ල**

**අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද සහ හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

01. රක්වාන සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2010.11.13 වැනි දින පෙරවරු 10.00 ට පැල්මඩුල්ල දිසා මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳ හිමිකම් පාන්නන් වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය පැවැත්වීමට පැය භාගයකට පෙර රෙජිස්ට්‍රාර් වරයාගේ අනුමැතිය මත අදාළ භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරන ලන්සුව නොපිළිගන්නා අවස්ථාවක අදාළ භාණ්ඩය වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයට බලය ඇත.

05. මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු ය.

06. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාර නොගැනේ.

07. ගැණුම් කරුවන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

එන්. ඩබ්. එච්. ඩී. සී. එන්. ඩයස්,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
පැල්මඩුල්ල, රක්වාන.

2010 ඔක්තෝබර් මස 04 වැනි දින,
පැල්මඩුල්ල දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| | | |
|---|---|---|
| 01. | 39290 | අත් ට්‍රැක්ටර් ට්‍රේලරය සහ රවුම් කියත් තලය |
| 02. | 38831 | අත් ට්‍රැක්ටර් ට්‍රේලරය සහ රවුම් කියත |
| 03. | 38830 | අත් ට්‍රැක්ටර් ට්‍රේලරය සහ රවුම් කියත |
| 04. | 27241 | අත් ට්‍රැක්ටර් ට්‍රේලරය |
| 05. | ඒ. ආර්. 420/09 | අත් ට්‍රැක්ටර් ට්‍රේලරය |
| 06. | අංක රහිත | අත් ට්‍රැක්ටර් ට්‍රේලරය |
| 07. | 38589 | එන්ජිම සහ රවුම් කියත් තලය |
| 08. | 33300 | සීෆෑන් වර්ගයේ එන්ජිම |
| 09. | 22944 | ෆයිබර් ග්ලාස් බෝට්ටුව |
| 10. | 39351 | අංක අපැහැදිලි වායු සැපයුම් යන්ත්‍රය |
| | එන්ජිම කොටස | |
| 11. | 39352 | වායු සැපයුම් නලය |
| 12. | 40110 | කම්පෙෂරය සහ වායු සැපයුම් නලය |
| 13. | 22908 | තේක්ක ඇදන් 17 යි |
| 14. | 31507 | තේක්ක ඇදන් 04යි |
| 15. | 32155 | ටකරන් 03 යි (10 x 10) |
| 16. | 31382 | සෝනි එරික්සන් ජංගම දුරකථනය (කේ 320) |
| 17. | 29438 | සොංෂිං වර්ගයේ ලියාපදිංචි නොකළ |
| | | යතුරු පැදිය |
| 18. | ඒ. ආර්. 1262/08 | අංක ඩබ්. පී. ටී. එල්. 7164 සී. ටී. 100 |
| | | යතුරු පැදිය |
| 19. | ඒ. ආර්. 105/07 | මයික්‍රො වර්ගයේ අවන් 01 යි |
| 20. | ඒ. ආර්. 608/08 | විශාල ප්‍රමාණයේ ඔක්සිජන් ටැංකි 01 යි |
| 21. | ඒ. ආර්. 1598/08 | ඕල්ටනේටරයක් සහ ස්විච් බෝඩ් 01 යි |
| 22. | ඒ. ආර්. 1321/08 | සෝනි එරික්සන් වර්ගයේ ජංගම දුරකථනය |
| | | සහ මෝටරෝලා ජංගම දුරකථනය |
| 23. | ඒ. ආර්. 544/09 | නොකියා වර්ගයේ ජංගම දුරකථනය |
| 24. | අංක රහිත | නොකියා වර්ගයේ ජංගම දුරකථනය |
| 25. | ඒ. ආර්. 542/09 | ලුමාලා වර්ගයේ පාපැදිය |
| 26. | ඒ. ආර්. 443/09 | ට්‍රොපිකල් වර්ගයේ යාන්ත්‍රික කියත |
| 27. | ඒ. ආර්. 517/08 | වායු පීඩන යන්ත්‍රයක් සහ කැට කූඩය |
| 28. | 30248 | කුඩා කොටස් වලට කැපූ තඹ කම්බි |
| | පාර්සලය | |
| 29. | අංක රහිත | ඇඳුම් උදලු තොගයක් |
| 30. | අංක රහිත | ඇළුමිනියම් වලං කිහිපයක් |
| 31. | අංක රහිත | තඹ දගර තොගයක් |
| 32. | අංක රහිත | සවල කිහිපයක් |
| 33. | අංක රහිත | යකඩ තාච්චි කිහිපයක් |
| 34. | අංක රහිත | හොස් බට තොගයක් |
| 35. | අංක රහිත | යකඩ බැරල් තොගයක් |
| 36. | අංක රහිත | ප්ලාස්ටික් බූලි හා කෑන් තොගයක් |
| 37. | අංක රහිත | යකඩ ඉණි කිහිපයක් |
| 38. | අංක රහිත | උදලු කිහිපයක් |
| 39. | | කැනන් වර්ගයේ පාවිච්චියෙන් ඉවත් කරන |
| | | ලද ඡායා පිටපත් යන්ත්‍රයක් |
| 40. | | ගලවා ඉවත් කරන ලද ඇස්බැස්ටස් තහඩු |
| | | 11 ක් පමණ |
| 41. | | ගලවා ඉවත් කළ සින්ක් 01 යි |
| 42. | | පාවිච්චියෙන් ඉවත් කළ මේස විදුලි පංකා |
| | | 01 යි |

11- 38

---

# රජයේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගාල්ල කන්දෙවත්ත පාර අංක 04 හි පදිංචි ඉමදුම වික්‍රම ආචාරිගේ සුජිත් චමින්ද වන මා විසින් ගාල්ල උළුවිටිකේ ඕපාත, ඕපාත ගොඩවත්ත පදිංචි හපුගොඩ ආරච්චි කංකානම්ගේ මහින්දදාස යන අයට දී ඇති අංක 3350 දරන 2008.11.07 වැනි දින ගාල්ල කොටුව පදිංචි සමන් රේණුකා නාරංගොඩ යන ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2010.10.21 වැනි දින සිට අවලංගු වන බව ශ්‍රී ලංකා ජනරජයටත් ජාතික ගමනා ගමන කොමිසන් සභාවට හා රට වැසියන්ටත් මින් දන්වා සිටිමි.

අයි. ඩබ්ලිව්. ඒ. සුජිත් චමින්ද.

11-43

---

**දැනුම් දීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව ඇඩ්රා ඉනෝවේටිව් (ප්‍රයිවට්) ලිමිටඩ් 2010 මාර්තු 26 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ඇඩ්රා ඉනෝවේටිව් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 71714
ලියාපදිංචි දිනය : 2010 මාර්තු 26
ලියාපදිංචි ලිපිනය : අංක 128/2, ඇබිල්ලවත්ත පාර, බොරලැස්ගමුව.

සමාගම් අධ්‍යක්ෂ.

11-40

---

**දැනුම් දීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පවර්නෙට් ලංකා (පීවීටී) එල්ටීඩී 2010 සැප්තැම්බර් මස 21 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : පවර්නෙට් ලංකා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී. වි. 74441
ලියාපදිංචි දිනය : 2010 සැප්තැම්බර් 21
ලියාපදිංචි ලිපිනය : අංක 260/3, වික්ටෝරියා ප්ලේස්, ඇල්විටිගල මාවත, කොළඹ 08.

සමාගම් අධ්‍යක්ෂ.

11-41

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

දැරණියගල රුකාෂල්වත්තෙහි පදිංචි සින්නයියා කාලිදාස් වන මා කොස්ගම කණම්පැල්ල අවිස්සාවේල්ල ලිපිනයෙහි පදිංචි හේනපලගේ මල්මි උදේශිකා (ජා. හැ. ප. 835310027 V ) යන අයට ප්‍රසිද්ධ නොතාරිස් සම්පත් ශ්‍රී රෝහණ සිංහ පුංචිහේවා විසින් ලියා සහතික කළ අංක 124 සහ 2005.11.24 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් ලබා දෙන ලද ඇටෝර්නි බලකාරිත්වය වර්ෂ 2010.10.19 වැනි දින සිට අවලංගු කරන ලද බවත්, එදිනට පසු ඇය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බවත්, වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිමි.

සින්නයියා කාලිදාස්.

11-42

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් පෞද්ගලික සමාගම එහි නාමය සහ ස්වභාවය වෙනස් කිරීම පිළිබඳ දැන්වීම :

පැරණි නාමය : ඔරියන්ට් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
වර්තමාන නාමය : ඔරියන්ට් ගාමන්ට්ස් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 9346
ලියාපදිංචි කාර්යාලය : අංක 49/16, අයිස්ලන්ඩ් ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ 03

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ඔරියන්ට් ගාමන්ට්ස් ලිමිටඩ් සඳහා සහ වෙනුවෙන්
පී. ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පී.වී.ටී) එල්.ටී.ඩී)
සමාගමේ ලේකම්වරුන්.

11-55

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

කුරුවිට දෙල්ගමුව, මානෙල් නිවසේ පදිංචි බන්දුල කන්කානමලාගේ අජිත් ධර්මසිරි බන්දුලගේ වන මම කුරුවිට ප්‍රසිද්ධ නොතාරිස් අනුර මනම්පේරි මහතා විසින් 2006 ජනවාරි මස 25 වැනි දින ලියා සහතික කරන ලද අංක 907 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් කුරුවිට දෙල්ගමුව මානෙල් නිවසෙහි පදිංචි බන්දුල කන්කානමලාගේ නිමල් ධර්මසිරි බන්දුලගේ යන අයට පවරන ලද ඇටෝර්නි බලය 2010.10.07 වැනි දින සිට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

මින් මතු උක්ත බන්දුල කන්කානමලාගේ නිමල් ධර්මසිරි බන්දුලගේ යන අය විසින් එකී ඇටෝර්නි බලපත්‍රය උපයෝගි කර ගනිමින් සිදුකරනු ලබන කිසිදු කටයුත්තකට මා වග නොකියන බව ද මෙයින් දන්වා සිටිමි.

බී. කේ. අජිත් ධර්මසිරි.

11-53

---

**පොදු නිවේදනය**

පෞද්ගලික සමාගමක් පෞද්ගලික නොවන සීමාසහිත සමාගමක් බවට පත් කිරීම සමග එහි නාමය වෙනස් වීම

ශ්‍රී ලංකාවේ ස්ථාපිත 2007 සමාගම් පනතේ අංක 7 යටතේ නැවත ලියාපදිංචි PB 553 PV අංකය දරන අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි හේලීස් ටර්මිනල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2007 අංක 7 දරන සමාගම් පනතේ (සමාගම් පනත) 28 ඡේදයේ නියමයන්ට අනුකූලව 2010 ඔක්තෝබර් මස 7 වැනි දින සිට පෞද්ගලික නොවන " සීමාසහිත" සමාගමක් බවට පත් කරනු ලැබූ හෙයින්, එම සමාගමේ නාමය, හේලීස් ටර්මිනල්ස් ලිමිටඩ්, යනුවෙන් වෙනස් වූ බැව් සමාගම් පනතේ 11(5) ඡේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2010 ඔක්තෝබර් මස 14 වැනි දින,
අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10.

11-50

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කෙරෙන ප්‍රසිද්ධ දැන්වීම :

සමාගමේ නාමය : සුමේධ ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 74957
ලියාපදිංචි ලිපිනය : අංක : 883/22, මල් පාර, ඇතුල් කෝට්ටේ, කෝට්ටේ.

සමාගම් ලේකම්.

11-79

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන නව සමාගම් පනතේ 9 වැනි වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනයන් සිමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී.

| *සමාගමේ නම* | *අංකය* | *ලියාපදිංචි දිනය* |
|---|---|---|
| ස්ටීම් බෝට් පුද්. සමාගම | පීවී 73864 | 2010.08.19 |
| ලි. ප. ලිපිනය | අංක 14, නාරාහේන්පිට පාර, නාවල. | |

ලේකම්.

11-81/1

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන නව සමාගම් පනතේ 9 වැනි වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනයන් සිමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී.

| *සමාගමේ නම* | *අංකය* | *ලියාපදිංචි දිනය* |
|---|---|---|
| ස්ටීම් බෝට් රෙස්ටුරන්ට් පුද්. සමාගම | පීවී 73963 | 2010.08.19 |
| ලි. ප. ලිපිනය | අංක 154, කින්සි පාර, කොළඹ 07. | |

ලේකම්.

11-81/2

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : නිකෝඩ් කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් කන්සල්ටන්සි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 73847
සංස්ථාගත කළ දිනය : 2010 අගෝස්තු 18
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 59 1/1, හයිලෙවල් පාර, කිරුළපන, කොළඹ 06.

අධ්‍යක්ෂ.

11-83

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහතින් සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමි.

සමාගමේ නම : සී/ස ටෙලිඅයි ලංකා (පුද්ගලික) සමාගම TELE EYE LANKA
සමාගමේ අංකය : PV 74673
සමාගම ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 221, වෝඩ් පෙදෙස, කොළඹ 07
ලියාපදිංචි කළ දිනය : 2010 ඔක්තෝබර් මස 06 වැනි දින

සමාගම් ලේකම්වරු,
සී/ස කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික).

11-84

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමි.

සමාගමේ නම : ඉන්ඩියන් ඕෂන් පී ඇන්ඩ් අයි ක්ලබ් ඔෆ් සිලෝන් ඇසෝසියේෂන්
ලියාපදිංචි අංකය : GA 2450
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
ලියාපදිංචි කළ දිනය : 2010.09.07.

සමාගම් ලේකම්වරු,
කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්,
(ප්‍රයිවෙට්) ලිමිටඩ්.

11-85

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමි.

සමාගමේ නම : ලෝරා ප්‍රොපර්ටි ඉලවන් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 74739
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07.

සමාගම් ලේකම්වරු,
කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්,
(ප්‍රයිවෙට්) ලිමිටඩ්.

11-86

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : සී/ස ලෝරා ප්‍රොපටීස් ටුවෙන්ටි ටූ (පුද්ගලික) LORA PROPERTIES TWENTY TWO
ලියාපදිංචි අංකය : PV 74655
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සමාගම ලියාපදිංචි කළ දිනය : 2010.10.01

සමාගම් ලේකම්වරු,
සී/ස කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්,
පුද්ගලික

11-87

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : සී/ස එන්වයර්මන්ටල් ඉනෝවේෂන්ස් (පුද්ගලික) ENVIRONMENTAL INNOVATIONS
ලියාපදිංචි අංකය : PV 74651
සමාගම් කාර්යාලයේ ලිපිනය : 51 C, හුලුදාගොඩ පාර, ගල්කිස්ස
ලියාපදිංචි කළ දිනය : 2010 ඔක්තෝබර් 01

සමාගම් ලේකම්වරු,
සී/ස කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්,
පුද්ගලික

11-88

---

**ඇටර්නි බලය අවලංගු කිරීම**

කටාන කෝන්ගොඩමුල්ලේ අංක 203 හි පදිංචි රත්නායක මුදියන්සේලාගේ මාකස් ඉග්නේෂියස් (පු. හැ. අංක 592722496 V) වන මා විසින් වෙන්නප්පුව, උල්හිටියාවේ ශාන්ත සේවියර් මාවතෙ අංක 688 හි පදිංචි මදුරාවලගේ දෝන සුදර්ශනී ලූඩ්ස් කුමුදිනි (පු. හැ. අංක 7362293048 V) නැමැත්තිය මාගේ ඇටර්නි බලකාරිය ලෙස පත්කරමින්, ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ඩී. පී. සරත් ස්ටැන්ලි මහත්මයාගේ සහතික කිරීම යටතේ 2003.11.21 වැනි දින නිකුත් කරන ලද අංක 5276 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කොට බලරහිත කළ බවත්, එබැවින් ඉහත කී මදුරාවලගේ දෝන සුදර්ශනී ලූඩ්ස් කුමුදිනි නැමැත්තිය මා වෙනුවෙන් මින් මතුවට යම් ක්‍රියාකාරකමක යෙදේ නම් ඒ පිළිබඳව වගකීම කිසිසේත් ම මා නොදරන බවත්, ශ්‍රී ලංකා ජනරජය හා මහජනතාව වෙත මෙයින් දන්වා ප්‍රකාශ කර සිටිමි.

මෙයට,
රත්නායක මුදියන්සේලාගේ මාකස් ඉග්නේෂියස්.

11-97

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

ලියාපදිංචි සමාගමේ නම : රණජය ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 74735
ලියාපදිංචි කළ දිනය : 2010.10.06
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 284/බී/20, රාජසිංහ මාවත, හේවාගම, කඩුවෙල.

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස්
ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

11-112

---

**වගකීම් සීමාසහිත සමාගමක් පිහිටුවීම සඳහා වූ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

සමාගමේ නම : අන්නා ලංකා ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 73374
ලියාපදිංචි කාර්යාලය : අංක 193/1 - 1/1, කාසල් වීදිය, කොළඹ 08.

11-109/1

---

**වගකීම් සීමාසහිත සමාගමක් පිහිටුවීම සඳහා වූ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ජග්දම්බා ටුවර් ට්‍රක් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 72865
ලියාපදිංචි කාර්යාලය : අංක 193/1 - 1/1, කාසල් වීදිය, කොළඹ 08.

11-109/2

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : කලම්බු ඉන්ටර්නැෂනල් මෙඩිකල් ස්කූල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 74913
සංස්ථාපිත දිනය : 2010.10.14
ලියාපදිංචි ලිපිනය : අංක 655/4, ඇල්විටිගල මාවත, කොළඹ 05.

ඒ. ඒ. පී. දමයන්ති,
සමාගම් ලේකම්.

11-22

---

**දැන්වීමයි**

පහත සඳහන් සමාගම ලියාපදිංචි කිරීම පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : සීමාසහිත කප්රුක ලංකා (පුද්ගලික)
සමාගමේ අංකය : පී. බී. 74594
ලියාපදිංචි කාර්යාලය : ඔස්ට්‍රේලියන් මයිග්‍රේෂන් කන්සල්ටන්ට්ස් සිනමන් ලේක් සයිඩ්, බිම් මහල, අංක 115, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02, ශ්‍රී ලංකාව.
ලියාපදිංචි කළ දිනය : 2010.09.29

ඉහත සඳහන් සමාගම වෙනුවෙන් එහි ලේකම්,

එල්. ඒ. පතිරවිතාන,
නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස්
සහ සමාගම් ලේකම්.

අංක 179/13, වැලිවිට පාර,
මාලබේ.
දුරකතන අංකය : 077-3738532.

11-125

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : මැක්බ්‍රිජ් බිල්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2010.10.01
සමාගමේ අංකය : පී. වී. 74646
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 407/23 බී, පරණ කොට්ටාව පාර, නුගේගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

ජෙනිවීව් පියුම්මිනී රණසිංහ,
සමාගම් ලේකම්.

11-126

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධ ප්‍රසිද්ධ දැන්වීමයි

ලියාපදිංචි සමාගමේ නම : ට්‍රාන්ස්නැෂනල් සවිසස් (පීවීටී) (එල්ටීඩී)
ලියාපදිංචි සමාගමේ අංකය : PV 74625
ලියාපදිංචි කළ දිනය : 2010.10.01
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 96/32, පරණ කැස්බෑව පාර, නුගේගොඩ.

සමාගම් ලේකම්.

11-127

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කෙරෙන විකිණීම පිළිබඳ දැන්වීම

**නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී. එල්. සී. (කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්) වෙත උකස් කරන ලද වටිනා දේපළ**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළයේ අඹතලේ පහළ, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ අවිස්සාවේල්ල පාරේ කුඩාබුත්ගමුව ගමේ පිහිටි වරිපනම් අංක 6/8 දරන මිල්ලගහලන්ද නොහොත් වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බන්දුල රණතුංග විසින් මැන සාදන ලද අංක 36/2007 සහ 2007.03.08 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් B නමැති බෙදා වෙන් කළ පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) නොහොත් හෙක්ටයාර් 0.02529ක් විශාල බිම් කැබැල්ල සහ ඊට අදාළ මාර්ග අයිතිය ද සමගය.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නිරෝධා සුපේක්ශලී කලන්සූරිය විසින් ලියා සහතික කරන ලද අංක 844 සහ 2007 දෙසැම්බර් මස 13 වැනි දින දරන උකස් බැදුම්කරය මත කොළඹ 09, දෙමටගොඩ, කෙන්ට් පාරේ අංක B 2/2 දරන ස්ථානයේ පදිංචි විජේසූරිය ආරච්චිගේ ඩෙරික් වර්නන් පෙරේරා යන අය විසින් ඉහත කී බැංකුවට උකස් කරන ලද දේපළ ඉහත කී බැංකු විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව 2010.12.22 වැනි දින පෙ.ව . 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම සඳහා 2009.12.04 වැනි දින ගැසට් පත්‍රය සහ 2010.02.10 වැනි දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු ය :

01. ගැණුම් මිලෙන් 10%ක් (ගැණුම් මිලෙන් ඉතිරි 90% සහ ගැණුම් මිල මත අයවිය යුතු ව්‍යවස්ථාපිත හා අනෙකුත් සියලු බදු සමග වෙන්දේසියේ දින සිට දින 30 ක් ඇතුලත ගෙවිය යුතු ය.),
02. ගැණුම් මිලෙන් 1% ක් ප්‍රාදේශීය සභා බදු ලෙස අදාළ ප්‍රදේශීය සභාවට ගෙවිය යුතු වේ,
03. ගැණුම් මිලෙන් 2.5% ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතු ය,
04. ප්‍රචාරක ගාස්තුවලින් 50% ක් ගෙවිය යුතු ය,
05. ලිපිකරු සහ සෝෂක ගාස්තු රු. 500,
06. නොතාරිස් ගාස්තුව රු. 2,500 යි.

*හිමිකම් ඔප්පු සහ අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු සඳහා විමසීම්.-* කළමණාකරු, පාරිභෝගික නීති කටයුතු නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, පී. එල්. සී. අංක 256, ශ්‍රීමත් රාමනාදන් මාවත, කොටහේන, කොළඹ 15.

දුරකතන අංක : 077-3918733/0114-682403.

අයි. සී. ඒ. පෙරේරා,
සාමවිනිසුරු,
උසාවි කොමසාරිස්,තක්සේරුකරු සහ වෙන්දේසිකරු.

අංක 86, නව නුවර පාර, වැලිවේරිය,
දුරකථන අංක : 033-2255115/0773 - 698690.

11-52

---

**සීමාසහිත ඩී එෆ් සී සී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 1563 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ (DDC Gampaha) අංක 02 හැඳල උප කාර්යාල බල ප්‍රදේශය ඇතුළත, හැඳල, කෙරවළපිටිය ග්‍රාමයෙහි පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඩබ්ලිව්. තිලකරත්න විසින් මැන සාදන ලද 1989 ජුනි මස 15 වැනි දිනැති අංක 104A දරන පිඹුරු පතෙහි ලොට් අංක 294 ලෙස දක්වා ඇති සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක්. 01 රූඩ් 01 පර්. 0 මෑතකදී කරන ලද මැනීමකට අනුව ඉහත ඉඩම පහත පරිදි විස්තර වේ :

මෑතකදී කරන ලද මැනීමකට අනුව ඉහත ඉඩම පහත පරිදි විස්තර වේ :බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවට සහ හැඳල උප කාර්යාල බල ප්‍රදේශයට අයත් හැඳල කෙරවළපිටිය ග්‍රාමයෙහි පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඩී. සී. ඒ. පෙරේරා විසින් මැන සාදන ලද 2001 සැප්තැම්බර් මස 05 වැනි දිනැති අංක 2225 දරන පිඹුරේ ලොට් අංක A ලෙස දක්වා ඇති මාගම්මනමුලවත්ත සහ ඇටම්පොළවත්ත ලෙස හැඳින්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය අක්. 01 රූඩ් 01 පර්. 9.36 එහි පිහිටි ගොඩනැගිලි සහ සියල්ල සහිතව.

පහත සඳහන් ඉඩම් හරහා වැටී ඇති මාර්ග අයිතියද සමග,

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ (DDC Gampaha) අංක 02 හැඳල උප කාර්යාල බල ප්‍රදේශය ඇතුළත, හැඳල කෙරවළපිටිය ග්‍රාමයෙහි පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඩබ්ලිව්. තිලකරත්න විසින් මැන සාදන ලද 1989 ජුනි මස 15 වැනි දිනැති අංක 104A දරන පිඹුරු පතෙහි ලොට් අංක 290 ලෙස දක්වා ඇති සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය අක්. 02 රූඩ් 01 පර්. 03

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ (DDC Gampaha) අංක 02 හැඳල උප කාර්යාල බල ප්‍රදේශය ඇතුළත, හැඳල කෙරවළපිටිය ග්‍රාමයෙහි පිහිටා ඇති බලයලත් මිනින්දෝරු ඒ. ඩබ්ලිව්. තිලකරත්න විසින් මැන සාදන ලද 1989 ජුනි මස 15 වැනි දිනැති අංක 104A දරන පිඹුරේ ලොට් අංක 37 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය අක්. 01 රූඩ් 00 පර්. 05

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2010 මාර්තු මස 30 වැනි දින සිට ලුතිතන් කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික ලුතිතන් කර්නල් සමන් නිලවීර ඒටීඕ ශ්‍රීලයුයුබ (නි/60676)

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2010 මාර්තු මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බළ හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් කර්නල් සමන් නිලවීර ඒටීඕ ශ්‍රීලයුයුබ (නි/60676)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2010 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.

11-69

---

## ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

**කොළඹ විශ්වවිද්‍යාලය**

2009 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂ පත්‍රය

| | *2009* රු. | | *2008* රු. | |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| ජංගම නොවන වත්කම් | | 1,15,04,38,159 | | 1,08,13,07,711 |
| දේපළ පිරියත හා උපකරණ | | 46,49,72,351 | | 27,36,30,468 |
| කෙරීගෙන යන වැඩ | | 67,75,75,541 | | 50,87,43,504 |
| ආයෝජන | | | | |
| **ජංගම නොවන වත්කම් - වෙනත්** | | | | |
| විවිධි ණයගැතියෝ | 69,72,492 | | 42,37,273 | |
| සේවක ණය සහ අත්තිකාරම් | 13,61,09,831 | | 11,60,54,485 | |
| සැපයුම් සේවා ණය | 58,71,072 | | 76,315 | |
| විවිධ අත්තිකාරම් | 8,22,622 | | - | |
| වෙනත් විශ්ව විද්‍යාලවලින් ලැබිය යුතු මුදල් | - | 14,97,76,017 | 3,69,649 | 12,07,37,723 |

| | *2009* රු. | | *2008* රු. | |
|---|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | | |
| බඩු තොග | 64,20,426 | | 67,28,898 | |
| විවිධ ණය ගැතියෝ | 3,23,24,562 | | 2,56,18,090 | |
| සැපයුම් සේවා ණය අත්තිකාරම් | 95,17,442 | | 1,79,43,678 | |
| විවිධ අත්තිකාරම් | 20,51,294 | | 42,79,926 | |
| වෙනත් විශ්වවිද්‍යාලවලින් ලැබිය යුතු මුදල් | 8,75,425 | | 29,89,493 | |
| කලින් ගෙවීම් | 2,72,562 | | 3,20,220 | |
| මුදල් සහ මුදල් හා සමාන දේ | 4,39,55,511 | 9,54,17,223 | 4,07,73,603 | 9,86,53,908 |
| **මුළු වත්කම්** | | 2,53,81,79,290 | | 2,08,30,73,314 |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා බැරකම්** | | | | |
| **ප්‍රාග්ධනය** | | | | |
| වැය වූ මූලධන ආධාර | 1,74,16,21,092 | | 1,53,08,74,786 | |

| | 2009 රු. | | 2008 රු. | |
|---|---|---|---|---|
| වැය නොවූ මුලධන ආධාර | (9,52,42,392) | | 2,41,18,444 | |
| ත්‍යාග සහ පරිත්‍යාග | 5,26,79,097 | 1,69,90,57,796 | 5,10,75,521 | 1,60,60,68,751 |
| **සමුච්චිත අරමුදල** | | | | |
| පොදු සංචිතය | 1,89,58,102 | | 1,89,58,102 | |
| ආදායම් සහ වියදම් ගිණුම | (51,94,28,086) | | (65,68,17,160) | |
| වත්කම් යළි තක්සේරු කිරීමේ සංචිතය | 6,21,81,349 | (43,82,88,635) | - | (63,78,59,058) |
| **සංචිත සහ නිශ්චිත අරමුදල්** | | | | |
| විශේෂිත සංචිත | 37,37,56,866 | | 28,35,87,900 | |
| ප්‍රදාන අරමුදල | 5,81,77,321 | | 5,16,49,778 | |
| පර්යේෂණ අරමුදල | 14,69,05,516 | | 13,25,24,859 | |
| බාහිර පාඨමාලා | 29,31,77,124 | | 26,14,92,428 | |
| ත්‍යාග සහ පරිත්‍යාග | 30,214 | | 30,214 | |
| වෙනත් | 1,39,97,871 | 88,60,44,911 | 1,39,57,121 | 74,32,42,300 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| පරිතෝෂිත දීමනා වෙන් කිරීම් | 30,78,41,213 | 30,78,41,213 | 30,73,50,755 | 30,73,50,755 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| ගෙවිය යුතු වියදම් | 2,25,04,766 | | 81,61,302 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 34,77,767 | 2.59,82,533 | 20,18,118 | 1,01,79,419 |
| **ජංගම වගකීම්** | | | | |
| ගෙවිය යුතු වියදම් | 1,19,38,988 | | 1,71,73,648 | |
| උපචිත වියදම් | 3,37,63,417 | | 2,58,21,061 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 1,18,39,066 | 5,75,41,472 | 1,10,96,437 | 5,40,91,146 |
| **මුළු වගකීම** | | **2,53,81,79,290** | | **2,08,30,73,314** |

මුල්‍යාධිකාරී විසින් පිළියෙල කර සහතික කරන ලදී.

කේ. එස්. ටී. ස්වර්ණලතා ජයසූරිය

පාලක සභාව සඳහා සහ ඒ වෙනුවෙන්,

මහාචාර්ය ක්ෂාණිකා හිරිඹුරේගම,
උපකුලපතිනි.

පී. එම්. එස්. බණ්ඩාර,
වැඩබලන ලේඛකාධිකාරී.

**කොළඹ විශ්වවිද්‍යාලය**

2009 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

(අගයන් ආසන්නතම රුපියලට වටයන ලදී)

| *ආදායම* | *2009* රු. | | *2008* රු. | |
|---|---|---|---|---|
| රජයේ ආධාර | 1,03,26,00,000 | | 95,65,00,000 | |
| (අ) රජයේ ආධාර (පුනරාවර්තන) | | | | |
| (ආ) රජයේ ආධාර - ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණ හා නඩත්තු | 1,17,50,808 | | 1,28,41,848 | |
| (ඇ) ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය | 8,87,12,745 | | 16,48,03,138 | |
| (ඈ) තොරතුරු තාක්ෂණ ප්‍රතිපාදන ක්‍රමක්ෂය | - | | 2,642 | |
| (ඉ) ශිෂ්‍යාධාර සඳහා ආධාර | 1,90,69,000 | | 1,58,58,800 | |
| (ඊ) මහපොළ සඳහා ආධාර | | | | |
| (i) වි. වි. ප්‍ර. කො. | 1,78,55,850 | | 1,83,55,350 | |
| (ii) මහපොළ භාරකාර අරමුදල් සංරචකය (ආදායම) | 9,34,88,950 | **1,26,34,77,353** | 10,71,67,100 | **1,27,55,28,877** |
| ලියාපදිංචි ගාස්තු (ප්‍රථම උපාධි) | 28,80,718 | | 22,17,440 | |
| ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි) | 9,82,561 | | 4,81,000 | |
| අධ්‍යයන ගාස්තු (ප්‍රථම උපාධි) | 2,65,76,804 | | 92,85,576 | |
| අධ්‍යයන ගාස්තු (පශ්චාත් උපාධි) | 69,80,105 | | 3.72,000 | |
| විභාග ගාස්තු (ප්‍රථම උපාධි) | 1,55,400 | | 1,15,790 | |
| විභාග ගාස්තු (පශ්චාත් උපාධි) | 7,88,515 | | 1,10,475 | |
| ණය සහ අත්තිකාරම්වලින් පොළිය | 54,51,399 | | 32,21,054 | |
| අයෝජන පොලී | 5,05,98,867 | | 4,88,63,690 | |
| ප්‍රකාශන විකුණුම් | 4,625 | | 36,600 | |
| දේපළ කුලී ආදායම | 11,85,858 | | 8,04,022 | |
| වෛද්‍ය ගාස්තු | 1,52,850 | | 3,29,100 | |
| පුස්තකාල දඩ | 8,20,933 | | 6,29,667 | |
| ව්‍යාපාරික කටයුතුවලින් | 28,38,460 | | 29,05,300 | |
| සුළු මිශ්‍ර ආදායම් | 1,24,67,911 | | 56,74,987 | |
| විදේශ විනිමය හුවමාරු ලාභය | 2,26,303 | | 3,06,438 | |
| බාහිර සේවා සැපයීම් | - | | 4,03,548 | |
| ගිවිසුම් කඩ කිරීමෙන් ආදායම | 80,69,971 | | 34,26,351 | |
| පරිත්‍යාග සහ ත්‍යාගවලින් ආදායම | - | | 1,40,299 | |
| බාහිර පාඨමාලා ආදායම | 22,69,14,478 | | 9,06,88,621 | |
| පර්යේෂණ ව්‍යාපෘති අරමුදල් ආදායම | 13,11,70,108 | | 4,97,54,752 | |
| බාහිර/පර්යේෂණ පාඨමාලාවලින් ආදායම් | 2,47,47,335 | | - | |
| ප්‍රදානයන් ලැබීම් | 19,06,136 | 50,49,19,334 | 12,32,166 | 22,09,99,055 |
| | | 1,76,83,96,687 | | 1,49,65,27,943 |
| **වියදම්** | | | | |
| පෞද්ගලික පඩිනඩි | | | | |
| වැටුප් සහ වේතන | 50,34,90,230 | | 50,31,63,769 | |
| වි. අ. අ. /සේ. භා. අ./විශ්‍රාම වැටුප් | 9,77,27,271 | | 9,94,77,459 | |
| දීමනා | 14,56,51,892 | | 11,67,20,292 | |
| අතිකාල/නිවාඩු දින ගෙවීම් | 2,87,00,808 | | 2,42,49,886 | |
| ගමන් වියදම් | 23,05,620 | | 47,25,176 | |
| සැපයීම් | 4,93,90,368 | | 4,84,57,757 | |
| වත්කම් නඩත්තු | 1,30,13,415 | | 1,51,58,491 | |
| කොන්ත්‍රාත්තුමය සේවා | 15,85,75,482 | | 16,02,01,792 | |
| වෙනත් | 3,88,56,134 | | 3,54,44,896 | |
| (i) මහපොළ ශිෂ්‍යත්ව - වි. වි. ප්‍ර. කො. ස. | 1,73,25,300 | | 1,75,28,500 | |
| (ii) මහපොළ ශිෂ්‍යාධාර සඳහා ආධාර (වියදම්) | 9,34,88,950 | | 10,71,67,100 | |
| ශිෂ්‍යාධාර | 1,66,50,300 | | 1,41,89,022 | |
| ක්ෂය වීම් | 8,87,12,745 | | 16,62,39,874 | |
| පාරිතෝෂිත දීමනා වෙන් කිරීම් | 1,87,38,702 | | 2,91,14,862 | |
| බාහිර පාඨමාලා වියදම් | 22,69,14,478 | | 9,06,88,621 | |
| පර්යේෂණ ආධාර මත වියදම් | 13,11,70,108 | | 4,97,54,752 | |
| ප්‍රදානයන් සහ ශිෂ්‍යත්ව | 19,06,136 | | 12,32,166 | |
| ඉවත් කරන ලද වත්කම් විකිණීමෙන් ලාභය/පාඩුව | - | | 1,58,490 | |
| ගොඩනැගිලි (පුනරාවර්තන පුනරුත්ථාපනය) | 1,17,50,808 | 1,64,43,69,747 | 1,28,41,848 | 1,49,65,14,752 |
| වියදමට වඩා වැඩි ආදායමේ අතිරික්තය | | 12,40,26,940 | | 13,182 |
| ආදායම් හා වියදම් විසර්ජන ගිණුම | | | | |
| ආදායම් හා වියදම් ගිණුම් ශේෂය | | 12,40,26,940 | | 13,182 |
| පසුගිය වර්ෂයේ ගැලපීම් | | 1,33,62,134 | | (16,82,57,892) |
| ආදායම් හා වියදම් ගිණුමේ ශේෂය ඉ/ගෙ/ආ | | (65,68,17,160) | | (48,85,72,449) |
| **ශේෂ පත්‍රයට ගෙන ගියා** | | **(51,94,28,086)** | | **(65,68,17,160)** |

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**

උපකුලපති
කොළඹ විශ්වවිද්‍යාලය,

**කොළඹ විශ්වවිද්‍යාලයේ 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

කොළඹ විශ්වවිද්‍යාලයේ 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) හා 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 **විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂයය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ අගැයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍යවන ප්‍රමාණවත් තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂයය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වැනි වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය :

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, කොළඹ විශ්ව විද්‍යාලය 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2009 දෙසැම්බර් මස 31 වැනි දිනට කොළඹ විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම :

2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2009 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වූ විගණන නියැදි පරීක්ෂණවල දී අනාවරණය වූ එකතුව රු. 761,611ක් වූ ගණකාධිකරණ අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත යොමු කරන ලදී. එම ගණකාධිකරණ අඩුපාඩු නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2010 මැයි මස 10 දින නැවත විගණනයට ඉදිරිපත් කරන ලදී.

2.2.2 නොසැසඳූ ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනට ආපදා ණය ගිණුමේ ශේෂය රු. 89,661,719ක් වූ අතර ඉදිරිපත් කර ඇති උපලේඛනයේ එම ශේෂය රු. 87,715,985ක් ලෙස දක්වා තිබුණි. වෙනස වූ රු. 1,945,734කට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි.

2.2.3 අවිනිශ්චිත ගිණුම්

විදේශ සැපයුම්කරුවන්ගේ හා ගෙවීම් අවිනිශ්චිත ගිණුම්වල පිළිවෙලින් රු. 37,541ක් හා රු. 135,011ක ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ගිවිසුම් කඩ කිරීම් වෙනුවෙන් ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ 10 පරිච්ඡේදයේ 33 වැනි වගන්තිය ප්‍රකාරව ගිවිසුම් කඩ කරන ලද ආචාර්යවරුන් 40ක ගෙන් රු. 28,425,044ක මුදලක් 2009 දෙසැම්බර් මස 31 වැනි දින වන විට අයවිය යුතුව තිබුණි.

(ii) ආචාර්යවරුන් 04ක ගෙන් අයවිය යුතු රු. 9,382,276ක මුදලක් අයකර ගැනීම සඳහා ඔවුනට විරුද්ධව නඩු පැවරීම සඳහා අදාල ලියකියවිලි නීතිපති දෙපාර්තමේන්තුවට යොමුකර තිබුන අතර ආචාර්යවරුන් 08ක ගෙන් අයවිය යුතු රු. 3,385,589ක මුදලක් වෙනුවෙන් අධිකරණයේ නඩු විභාග වෙමින් පැවතුණි.

(iii) ආචාර්යවරුන් 20ක ගෙන් අයවිය යුතු රු. 5,391,026ක මුදලක් ඔවුන්ගේ අර්ථසාධක හා පාරිතෝෂිත අරමුදලින් අයකර ගැනීමට යෝජිතව වසර 07කට අධික කාලයක් ඉක්මවා තිබු අතර එම මුදල් අයකර විශ්වවිද්‍යාල වෙත එවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කර ඇතත් සමාලෝචිත වර්ෂයේදීද එම මුදල් අයවී නොතිබුණි.

(ආ) එකතු වටිනාකම පිළිවෙලින් රු. 65,899ක්, රු. 293,608ක්, රු. 1,474,838ක් හා රු. 51,419ක් වූ පරිගණක ණය, වාහන ණය, ආපදා ණය හා සේවක ණය ශේෂයන්ගෙන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළ අයවී නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබිය යුතු රු. 821,910ක වටිනාකමින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළ අයකර නොතිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

2003 ජූලි මස 18 වැනි දිනැති ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ඇමතු ලිපිය ප්‍රකාරව අධ්‍යයන දීමනා හා මාසික හිලව් දීමනා සැලකිල්ලට ගෙන අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැරදි ලෙස ගණනය කර ගෙවා තිබු විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල්, සේවා නියුක්ත භාර අරමුදල් හා පාරිතෝෂිත දීමනා පිළිබඳ විගණකාධිපති වෙත 2003 ජූලි මස 31 දිනට පෙර ඉදිරිපත් කිරීමට නියෝග කර තිබූ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

2.2.6 අක්‍රිය බැංකු ගිණුම්

විශ්වවිද්‍යාලයේ පර්යේෂණ හා කළමනාකරණ ඒකකය විසින් පවත්වා තිබූ රු. 549,227ක ශේෂයක් තිබූ බැංකු ගිණුමක සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු ගණුදෙණුවක් සිදුකර නොතිබුණි.

2.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් පහත දැක්වේ :-

| *නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව* | *අනුකූල නොවීම* |
|---|---|
| (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/98, 29/98(i), 07/2007, 7/2000(i), 02/2009 සහ 1994 ජූනි මස 14 වැනි දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලින් බැහැරව විශ්වවිද්‍යාලය විසින් 2003 ජනවාරි මස 01 වැනි දිනට පෙර බඳවාගත් සේවකයින් හට භාෂා ප්‍රවීනතා දීමනාව ගෙවා තිබුණි. |
| (ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 2003 ජූලි මස 18 දිනැති ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ඇමතු ලිපිය | 2005 ජූලි මස 01 දිනට පෙර බඳවාගත් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල්, සේවා නියුක්ත භාර අරමුදල් හා පාරිතෝෂිත දීමනා දායකය ගණන් බැලීමේදී අධ්‍යයන දීමනාව සැළකිල්ලට ගෙන තිබුණි. |
| (ඇ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තියට | අදාල මාසික ගෙවීම් සීමා ඉක්ම වූ සේවා සැපයුම්කරුවෙකුගෙන් රඳවා ගැනීම් බදු අඩුකර නොතිබුණි. |
| (ඈ) මු. රෙ. 104 | විද්‍යාල මන්දිරයේ මධ්‍යම ගබඩාවේ රු. 70,398ක් වූ තොග ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) මු. රෙ. 371(2) | විද්‍යාල මන්දිරයේ පර්යේෂණ හා කළමනාකරණ ඒකකය හා ශ්‍රීපාලි මණ්ඩපය විසින් විවිධ කාර්යයන් සඳහා ලබාගත් එකතු වටිනාකම රු. 6,633,996ක් වූ අත්තිකාරම් මුදල් පියවීම වසර 01 සිට වසර 31ක කාලයක් ප්‍රමාදිතව තිබුණි. |

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය ගණන් ගැනීමට පෙර රු. 918,839,656ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූප ඌනතාවය රු. 969,328,666ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 50,489,010කින් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රු. 1,044,350,808ක් වූ රජයේ දායකය හේතුකොට ගෙන වර්ෂය සඳහා අතිරික්තය රු. 125,511,152ක් වූ අතර, ඉකුත් වර්ෂයේ රු. 969,341,848ක රජයේ දායකය හේතුකොට ගෙන එම වර්ෂයේ අතිරික්තය රු. 13,182ක් විය.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 අධ්‍යයන කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :-

(අ) 2009 වර්ෂය සඳහා බඳවා ගන්නා ලද උපාධි අපේක්ෂකයින් 2,189ක් වූ අතර මෙම උපාධි අපේක්ෂයන්ගේ සංයුතිය කලා අංශයෙන් 661ක් හෙවත් 30%ක් ද, නීති අංශයෙන් 250ක් හෙවත් 12%ක් ද, කළමනාකරණ හා මූල්‍ය අංශයෙන් 416ක් හෙවත් 19%ක් ද, විද්‍යා අංශයෙන් 534ක් හෙවත් 24%ක් ද, වෛද්‍ය අංශයෙන් 233ක් හෙවත් 11%ක් ද, ශ්‍රී පාලි මණ්ඩපයට 95ක් හෙවත් 4%ක් ද වශයෙන් සමන්විත විය ;

(ආ) සමාලෝචිත වර්ෂය තුළ අවසන් වසර සිසුන්ගෙන් උපාධි ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 1,838ක් වූ අතර එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී 24ක අඩුවීමකි. මෙම උපාධි අපේක්ෂයන්ගේ සංයුතිය නීති අංශයෙන් 196ක් ද, විද්‍යා අංශයෙන් 332ක් ද, වෛද්‍ය අංශනේ 193ක් ද. ශ්‍රී පාලි මණ්ඩපය 49ක් ද, කලා අංශයෙන් 577ක් ද, අධ්‍යාපන අංශයෙන් 143ක් ද. කළමණාකරණ හා මූල්‍ය අංශයෙන් 348ක් වශයෙන් සමන්විත විය ;

(ඇ) 2009 වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 8,800ක් විය. එම ශිෂ්‍ය සංඛ්‍යාව අධ්‍යාපන පීඨය 296ක්, නීති පීඨය 872ක්, විද්‍යා පීඨය 1,674, කලා පීඨය 2,785ක් කළමනාකරණ හා මූල්‍ය පීඨය 1,621ක්, වෛද්‍ය පීඨය 1,234ක් හා ශ්‍රී පාලි මණ්ඩපය 318ක් වශයෙන් බෙදී ගොස් තිබුණි ;

3.2.2 දේශන පැය :

විගණනයට ලද තොරතුරු අනුව ප්‍රථම උපාධිධාරීන් වෙනුවෙන් 2008/2009 අධ්‍යයන වර්ෂය සඳහා අභ්‍යන්තර දේශන පැය 35,880ක් පවත්වා තිබුණි. එහි විද්‍යා පීඨය 6,482ක්, කළමනාකරණ හා මූල්‍ය පීඨය 4,950ක්, අධ්‍යාපන පීඨය 2,761ක්, නීති පීඨය 3,355ක්, වෛදය පීඨය 5,456ක්, ශාස්ත්‍ර පීඨය 12,876ක් වශයෙන් සමන්විත විය. ප්‍රථම

හා පශ්චාත් උපාධිධාරීන් සඳහා බාහිර දේශන පැය 15,888ක් පවත්වා තිබූ අතර විද්‍යා පීඨය පැය 555ක්, කළමනාකරණ හා මූල්‍ය පීඨය 600ක්, අධ්‍යාපන පීඨය 226ක්, නීති පීඨය 927ක්, වෛද්‍ය පීඨය, 1,714ක් හා ශාස්ත්‍ර පීඨය 11,866ක් වශයෙන් විය.

3.2.3 විභාග පැවැත්වීම :
සමාලෝචිත වර්ෂය තුළ පීඨ 06ක ප්‍රථම උපාධි විභාග 143ක් ද, පශ්චාත් ඩිප්ලෝමා විභාග 11ක් ද, පශ්චාත් උපාධි විභාග 19ක් ද, වෙනත් ඩිප්ලෝමා හා සහතික පත්‍ර විභාග 06ක් ද පවත්වා තිබුණි. උපාධි අධ්‍යයන පීඨයෙහි පශ්චාත් උපාධි ඩිප්ලෝමා විභාග 16ක් ද පශ්චාත් උපාධි විභාග 7ක් ද පවත්වා තිබුණි. මෙයින් විභාග 11ක ප්‍රතිඵල නිකුත් කර නොතිබුණි.

3.3. වැඩ තහනමට ලක්වූ ලේඛකාධිකාරිණියට විරුද්ධව පැවැත්වෙන විනය පරීක්ෂණය :
විශ්ව විද්‍යාල සඳහා වූ ආයතන සංග්‍රහයේ XXII පරිච්ඡේදයේ 11.1 වගන්තියට පටහැනිව විශ්වවිද්‍යාලයේ හිටපු ලේඛකාධිකාරිණියට එරෙහිව පැවැත්වෙන විනය පරීක්ෂණය මාස 5 1/2කට අධික කාලයක් ප්‍රමාදව ආරම්භ කර තිබූ අතර විනය පරීක්ෂණය, ආරම්භ කර වසරකට අධික කාලයක් ගතව ඇතත් පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.

3.4 වෛද්‍ය පීඨයේ ශායනික විද්‍යා අංශයේ ඉගෙනුම් සහ විභාග කටයුතු සඳහා යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම.
යථොක්ත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලය විසින් ටෙන්ඩර් කැඳවා රු. 47,644,950ක පිරිවැයකට (එකතුකළ අගය මත බදු හැර) කොන්ත්‍රාත් ගිවිසුමක් මත 2004 දෙසැම්බර් මස 17 දින පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය :-

(අ) අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලය විසින් අදාල කොන්ත්‍රාත්තුව පිරිනැමීමට 2004 මාර්තු මස 04 වැනි දින තීරණය කර තිබූ නමුත් අදාල කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කිරීම 2004 දෙසැම්බර් මස 07 වැනි දින දක්වා එනම් මාස 09කටත් අධික කාලයක් ප්‍රමාදව තිබුණි. භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබීමේ හේතුවෙන් මෙම තත්ත්වය උද්ගතවූ බව විගණනයට ලද පිළිතුරෙහි සඳහන් විය.

(ආ) ශ්‍රී ලංකා ඉදිකිරීම් පුහුණු සහ සංවර්ධන ආයතනය විසින් 1989 ජනවාරි මස නිකුත්කර තිබූ ඉදිකිරීම් කොන්දේසි ඇතුළත් අත්පොතෙහි 60(1) වගන්තිය ප්‍රකාරව මූලික අත්තිකාරමට අමතරව කොන්ත්‍රාත් වටිනාකමින් 10%ක උපරිමයකට යටත්ව අවස්ථා 02 ක දී අත්තිකාරම් ලබාදීම නිර්දේශ කර තිබුණි. නමුත් මෙම ව්‍යාපෘති ගිවිසුමෙහි අතිරේක අත්තිකාරම් ලබාදීමට කිසිදු ගිවිසුම්ගත එකඟතාවයක් නොතිබූ අතර අවස්ථා කිහිපයකදී එකතු වටිනාකම රු. 24,611,815ක් සෘජුවම විවිධ සැපයුම්කරුවන්ට අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

(ඇ) මාස 18කින් නිම කිරීමට ඇස්තමේන්තු කර තිබූ කොන්ත්‍රාත් කටයුතු 2006 ජූනි මස 08 වැනි දින නිම කිරීමට ගිවිසගෙන තිබූ නමුත් වසර 3 1/2කටත් අධික කාලයක් ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා ගත වී තිබුණි. ව්‍යාපෘති උපදේශකයින් ලෙස කටයුතු කරන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් 2007 ජූනි මස 19 වැනි දින උපකුලපති වෙත යොමු කළ ලිපිය අනුව ව්‍යාපෘති ප්‍රමාද ගාස්තු අයකිරීම නිර්දේශ කර තිබූ අතර ව්‍යාපෘති ගිවිසුමේ 47(1) ඡේදය අනුව ද කොන්ත්‍රාත් වටිනාකමින් 2.5%ක් ප්‍රමාද ගාස්තු ලෙස රු. 1,191,124ක් අයකර ගත යුතුව තිබුණි. නමුත් අතුරු ගෙවීම් නියෝග අංක 11 යටතේ 2007 ජූනි මස 25 දින රු. 525,000ක ප්‍රමාද ගාස්තුවක් අයකිරීම හැර පාලක සභාවේ තීරණ මත ඉන් පසු කිසිදු මුදලක් ප්‍රමාද ගාස්තු ලෙස කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොතිබුණි.

(ඈ) අමුද්‍රව්‍ය අත්තිකාරම් සඳහා ඉල්ලුම් ඇප රක්ෂණය සම්බන්ධයෙන් ව්‍යාපෘති ගිවිසුමෙහි කිසිදු ප්‍රතිපාදනයක් නොතිබූ අතර අදාල රක්ෂණයන් කොන්ත්‍රාත්කරු විසින් පුද්ගලිකව දැරිය යුතුව තිබියදී ගොඩනැගිලි හා මූල්‍ය කමිටු අනුමැතිය යටතේ විශ්වවිද්‍යාල විසින් එකතු වටිනාකම රු. 359,780ක මුදලක් විවිධ රක්ෂණයන් සඳහා සෘජුව ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් මෙම රක්ෂණයන් අලුත් නොකිරීමෙන් විශ්වවිද්‍යාලයට මුහුණදීමට සිදුවන විශාල අවදානම මගහරවා ගැනීම සඳහා ඉහත ගෙවීම් සිදුකළ බව විගණනයට ඉදිරිපත් කළ පිළිතුරෙහි සඳහන්ව ඇත.

4. පද්ධති හා පාලන
විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.
(අ) කොන්ත්‍රාත් පාලනය ;
(ආ) ගිවිසුම්ගත පාලනය ;
(ඇ) ගණකාධිකරණය ;
(ඈ) අත්තිකාරම් පියවීම.

එස්. ස්වර්ණජෝති,
විගණකාධිපති.

11-54

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 281751 සහ 313517.
කපිල ගලගොඩ ලියනගේ.
රණසිංහ ආරච්චිගේ ප්‍රියංකා විමරශානී.

2010 මාර්තු මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. කේ. ජයවර්ධන විසින් 2006 පෙබරවාරි මස 9 වැනි දින සහතික කරන ලද අංක 2561 සහ 2006 අගෝස්තු 04 වැනි දින සහතික කරන ලද අංක 2856 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කපිල ගලගොඩ ලියනගේ හෙවත් ගලගොඩ ලියනගේ කපිල සහ රණසිංහ ආරච්චිගේ ප්‍රියංකා විමරශානි හෙවත් ප්‍රියංකා විමරශානි ගලගොඩ ලියනගේ යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් මිලියන දෙකක් සහ හාරලක්ෂ අසූ දහස් එකසිය දහයක් සහ ශත විසි අටක (රු. 24,80,110.28) මුදලක් 2010 පෙබරවාරි මස 24 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන දෙකක් සහ හාරලක්ෂ අසූ දහස් එකසිය දහයක් සහ ශත විසි අටක (රු. 24,80,110.28) මුදල අයකර ගැනීම සඳහා සහ 2010 පෙබරවාරි මස 25 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 19,24,505.91ක මුදල මත 14%ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 2561 සහ 2856 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99හි අනුඥාලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බලයලත් මිනින්දෝරු ජේ. පී. අයි. අබේකෝන් විසින් 1995 මැයි මස 06 වැනි දින සාදන ලද පිඹුරු අංක 2678හි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, අඹතලෙන්පහල කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ අංගොඩ පිහිටි බටදොඹගහවත්ත සහ බටදොඹගහඹිවිට කියන ඉඩමේ ගොඩනැගිලි, ගහකොල, වගාවන් සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : බටදොඹගහ කුඹුර ද, නැගෙනහිරට : එම පිඹුරු අංක 2678 තුළ පිහිටි ලොට් 2 කොටස ද, දකුණට : පෙර කී පිඹුරු අංක 2678හි ලොට් 6 (අඩි 15ක් පළල පාර සඳහා වෙන්කරය) ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ජේ. පී. අයි. අබේකෝන් විසින් 1994 අප්‍රේල් මස 30 වැනි දින සාදන ලද පිඹුරු අංක 884හි පිහිටි ලොට් 2 සහ 3 යන ඉඩම් කැබලි ද යන මායිම් තුළ පෙර කී පිඹුරු අංක 2678ට අනුව පර්චස් විසිතුනයි දශම හයක් විශාල ඉඩම (අ. 0, රූ. 0, පර්. 23.6) කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B780/242 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

තවද පහත විස්තර කරන මාර්ග වෙන්කරය මතින් ගමන් කිරිමේ අයිතිය සහ එයට අදාල අනෙකුත් සියලුම අයිතීන් ද සමග යි.

පෙර කී අංගොඩ පිහිටි බටදොඹගහවත්ත සහ බටදොඹගහඹිවිට කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද පෙර කී පිඹුරු අංක 2678හි නිරූපිත ලොට් 6 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කරය) කොටසට මායිම්, උතුරට : පිඹුරු අංක 884හි දැක්වෙන ලොට් 3 කොටස සහ පෙර කී පිඹුරු අංක 2678 හි නිරූපිත ලොට් 1, 2 සහ 3 යන කොටස් ද, නැගෙනහිරට : එම පිඹුරු අංක 2678 තුළ පිහිටි ලොට් 4 කොටස ද, දකුණට : එම පිඹුරු අංක 2678 තුළ පිහිටි ලොට් 4 සහ 5 කොටස් ද බස්නාහිරට : ප්‍රගති මාවතේ සිට එන පාර ද යන මායිම් තුළ පෙර කී පිඹුරු අංක 2678ට අනුව පර්චස් දාහතරයි දශම තුනක් විශාල ඉඩම (අ. 0, රූ. 0, පර්. 14.3) කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B780/271 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

11-18

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 463342.
හෙන්ද හේවා චන්ද්‍රික.

2009 ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. විජේනාරායන විසින් 2008 අගෝස්තු මස 7 වැනි දින සහතික කරන ලද අංක 2693 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හෙන්ද හේවා චන්ද්‍රික ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් මිලියන දෙකක් සහ තුන්ලක්ෂ පනස් දෙදහස් තුන්සිය හතලිස් හතරයි ශත හතලිස්තුනක (රු. 23,52,344.43) මුදලක් 2009 ජූලි මස 10 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන දෙකක් සහ තුන්ලක්ෂ පනස් දෙදහස් තුන්සිය හතලිස් හතරයි ශත හතලිස්තුනක (රු. 23,52,344.43) මුදල අයකර ගැනීම සඳහා සහ 2009 ජූලි මස 11 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 19,66,650ක මුදල මත 23%ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 2693 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99හි අනුඥාලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, බලපිටියේ ගාලු පාරේ පිහිටි වරිපනම් අංක 361 දරන අන්දරගහවෙල වත්ත හෙවත් කොරල්කඩවත්ත ලඟ වත්ත කියන ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ, වගාවන්, සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කර ලොට් ඒ කොටසෙහි ලොට් ඒ 1 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : ඕවිට හෙවත් දුවේදොලවත්ත ද, දකුණට : එම ඉඩමේම ලොට් බී කොටස ද, බස්නාහිරට : ගාලු පාර ද යන මායිම් තුළ කලුතර බලයලත් මිනින්දෝරු එල්. ඩබ්. පෙරේරා විසින් 2002 සැප්තැම්බර් මස 4 වැනි දින සාදන ලද පිඹුරු අංක 547ට අනුව පර්චස් විසි තුනක (අ. 0, රූ. 0, පර්. 23) හෝ හෙක්ටයාර් 0.05817ක් විශාල ඉඩම. බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A275/51 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

පෙර විස්තර කරන ලද පිඹුරු අංක 547හි සලකුණු කර ඇති ලොට් ඒ1 නම් බිම් කොටස පහත විස්තර කරන ඉඩමේ වෙන් කරන ලද බිම් කොටසකි.

පෙර විස්තර කරන ලද බලපිටියෙහි පිහිටි අන්දරගහවෙල වත්ත හෙවත් කොරල්කඩවත්ත ලඟ කියන ඉඩමේ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කළ ලොට් ඒ සලකුණු කර ඇති බිම් කොටසට මායිම්,

උතුරට : වරධනයගෙවත්ත ද, නැගෙනහිරට : තේනහැන්දිගෙදරවත්ත ඕවිට හෙවත් දොවෙදලවත්ත ද, දකුණට : එම ඉඩමේම ලොට් බී කොටස ද, බස්නහිරට : ප්‍රධාන මාර්ගය ද යන මායිම් තුළ බලයලත් මිනින්දෝරු ඩබ්. වී. ගුණවර්ධන විසින් 1926 අගෝස්තු මස 24 වැනි දින සාදන ලද පිඹුරු අංක 125ඒ ට අනුව පර්චස් තිස් හතරයි දශම දෙකයි එකක් විශාල ඉඩම (අ. 0, රූ. 0, පර්. 34.21) ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C368/40 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

11-19

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය : 1510005642.
ණය ගිණුම් අංකය : 391090.
සුදුසිංහ මන්චනායක අප්පුහාමිලාගේ නිමල්සිරි.
රත්නායක මුදියන්සෙලාගේ නන්දාවතී.

2010 පෙබරවාරි මස 24 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. එස්. පී. පෙරේරා විසින් 2007 සැප්තැම්බර් මස 7 වැනි දින සහතික කරන ලද අංක 9635 ද, 2008 මාර්තු මස 3 වැනි දින සහතික කරන ලද අංක 10025 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සුදුසිංහ මන්චනායක අප්පුහාමිලාගේ නිමල්සිරි සහ රත්නායක මුදියන්සෙලාගේ නන්දාවතී යන අය ණයකරුවන් හැටියට ද, රත්නායක මුදින්සෙලාගේ නන්දාවතී උකස්කරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් මිලියන එකක් සහ හත්ලක්ෂ හැත්තෑ දහස් තිස් නවයයි ශත විසි හයක (රු. 17,70,039.26) මුදලක් 2009 නොවැම්බර් මස 12 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන එකක් සහ හත්ලක්ෂ හැත්තෑ දහස් තිස් නවයයි ශත විසිහයක (රු. 17,70,039.26) මුදල අයකර ගැනීම සඳහා සහ 2009 නොවැම්බර් මස 13 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 14,39,033.61ක මුදල මත 22%ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 9635 සහ 10025 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99හි අනුඥාලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බලයලත් මිනින්දෝරු පී. එන්. ගුණසිරි විසින් 2007 ජූලි මස 21 වැනි දින සාදන ලද පිඹුර අංක 5219 හි දැක්වෙන වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දකුණු කටුගම්පොල හත්පත්තුවේ, යටිකහ කෝරලේ, නාරංගල්ල සහ පුගල්ල යන ගම්මාන වල පිහිටි මහෙන්ද්‍ර එස්ටේට් කියන සහ හඳුන්වනු ඉඩමේ පස, ගහකොළ, වගාවන් සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු බී. ඒ. එස්. ෆිගරාඩෝ විසින් සාදන ලද පිඹුරු අංක 1601 තුළ පිහිටි ලොට් 4 කොටස ද, නැගෙනහිරට : පිඹුරු අංක 4620ඒ තුළ පිහිටි ලොට් 5 කොටස ද, දකුණට : පිඹුරු අංක 4620ඒ හි ලොට් 4 යන ප්‍රධාන මාර්ගයේ සිට නිවෙස් වෙතට ඇති අඩි දහයක් පළල පාර සඳහා වෙන්කරය ද, බස්නාහිරට : පිඹුරු අංක 4620ඒ හි පිහිටි ලොට් 1 යන ඉඩම් කැබලි ද යන මායිම් තුල පෙර කී පිඹුරු අංක 5219ට අනුව අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් තිස් පහක් විශාල ඉඩම් (අ. 2, රූ. 1, පර්. 35) කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ J175/63 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

11-17

---

## මහජන බැංකුව - කෑගල්ල කඩ වීදිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස්, රොමෙල් විජේවර්ධන මහතා විසින් සහතික කරන ලද 2006.11.01 දිනැති අංක 10389 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම උඩුගොඩ, එලගල්ල, නාරංසෙවන යන ලිපිනයෙහි පදිංචි පරණ ගල්ලත් රාල්ලාගේ රාජා තිලකරත්න සහ පරණ ගම්ලත් රාල්ලාගේ කල්‍යාණි කුමාරි ගම්ලත් යන අය විසින් පැහැර හැර ඇති බැවින්, එකී උකස්කරය යටතේ රුපියල් හාරලක්ෂ අසූදහස් හත්සිය හැට හතරයි ශත අසූ හත (රු. 4,80,764.87) ක මුදලක් හා 2009.07.18 දින සිට වර්ෂයකට සියයට දාහතරයි දශම පහ (14.5%) බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ ඉහත කී මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකර ගනු ලැබිය හැකි මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී ණය මුදල සඳහා රුපියල් හාරලක්ෂ අසූදහස් හත්සිය හැට හතරයි ශත අසූ හත (රු. 4,80,764.87) අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 10389 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තිරණය කරයි.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, කඳුපිට පත්තුවේ, කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ එලගල්ල යන ගම පිහිටි කෑගල්ල දිසා අධිකරණයේ අංක 21959 දරන බෙදුම් නඩුවේ තීන්දුව ප්‍රකාර බලයලත් මිනින්දෝරු ඇම්. බී. රණතුංග මහතා විසින් මැන සාදන ලද අංක කේ 2296/ඒ දරන පිඹුරේ සඳහන් නාරන්ගහමුල තැන්න වත්ත බෙදා වෙන් කළ අංක 1 (ඩී) දරන කොටස් පර්චස් එකොලහයි දශම පහයි බින්දුවක් (අක්. 0, රූ. 0, පර්. 11.50) ක් විශාල උතුරට : අංක 1 (සී) දරන කොටස ද, නැගෙනහිරට : ඉඩම්වලට යන පාර ද, දකුණට : පී. පී. ආර්. පුංචි බණ්ඩා සහ තවත් අයට අයිති නාරංගහමුල තැන්න වත්ත සහ බස්නාහිරට : පී. පී. ආර්. උක්කුබණ්ඩාට අයිති නාරංගහමුලතැන්න වත්ත යන මායිම් තුළ පිහිටි ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගසකොල, පළතුරු යනාදී සියලු දේ ද වේ.

මෙම ඉඩම කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක E 1149/228 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී කඳුපිට පත්තුවේ, කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ එලගල්ල යන ගම පිහිටි කෑගල්ල දිසා අධිකරණයේ අංක 21959 දරන බෙදුම් නඩුවේ තීන්දු ප්‍රකාර බලයලත් මිනින්දෝරු ඇම්. බී. රණතුංග මහතා විසින් මැන සාදන ලද අංක කේ. 2296/ඒ දරන පිඹුරේ සඳහන් නාරන්ගහමුල තැන්න වත්ත බෙදා වෙන් කළ අංක 02 (ඩී) දරන කොටස රූඩ් එකයි පර්චස් විසි දෙකයි දශම පහ (අ. 0, රූ. 1, පර්. 22.5) ක් විශාල උතුරට : ඉහත පිඹුරු පතේ සඳහන් අංක 2 (සී) දරන කොටස ද, නැගෙනහිරට : ගල් ඇන්ද සහිත අංක 03 දරන කොටස ද, දකුණට : සිරිවර්ධනට අයිති නාරංගහමුලතැන්න වත්ත ද, බස්නාහිරට : ඉඩම්වලට යන පාර ද යන මායිම් තුළ පිහිටි ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු යනාදී සියලු දේ ද වේ. මෙම ඉඩම කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ අංක E 1149/229 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකාර,

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කෑගල්ල.
11-117

---

## මහජන බැංකුව - දැරණියගල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස්, ඩී. එම්. සුසිල් හේරත් මහතා විසින් සහතික කරන ලද 2008.05.08 දිනැති අංක 649 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම දැරණියගල, නූරි පාර, අංක 15 යන ලිපිනයෙහි පදිංචි හත්කැල කලුවලාගේ අරුණ රන්පටිගේ දශක යන අය විසින් පැහැර හැර ඇති බැවින්, එකී උකස්කරය යටතේ රුපියල් විසිලක්ෂයක් (රු. 20,00,000) ක මුදලක් හා 2009.12.31 දින සිට වර්ෂයකට සියයට විසිදෙක (22%) බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ ඉහත කී මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකර ගනු ලැබිය හැකි මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී ණය මුදල සඳහා රුපියල් විසිලක්ෂය (රු. 20,00,000) අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 649 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තිරණය කරයි.

### උපලේඛනය

1. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරළේ, මෙගොඩපොත යටියන්තොට ප්‍රාදේශීය සභා සීමාව තුළ කබුළුමුල්ල ගමෙහි පිහිටි කොටස් නවයකින් යුත් බුළුගහවත්ත පහළ ඉරවල්ල නමැති දේපළට බලයලත් මිනින්දෝරු ඩී. එම්. ගමගේ මහතා විසින් 1989.12.31 දින මැන සාදන ලද අංක 599 දරන පිඹුරේ ලොට් අංක 06 දරන රූඩ් එකයි පර්චස් හතක් (අ. 0, රූ. 1, පර්. 7) ක් විශාල ඉඩමට මායිම්, උතුරට : ලොට් 07 ද, නැගෙනහිරට : මල ඇළ සහ කැළණි ගඟ ද, දකුණට : කැළණි ගඟ සහ ලොට් 05 ද, බස්නාහිරට : මහා මාර්ගය ද යන මායිම් තුළ ඇති ඉඩම සහ ඒ තුළ ඇති ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියළුදේ ද වේ.

මෙම දේපළ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ අංක S193/201 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

2. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරළේ, මෙගොඩපොත යටියන්තොට ප්‍රාදේශීය සභා සීමාව තුළ කබුළුමුල්ල ගමෙහි පිහිටි කොටස් නවයකින් යුතු බුළුගහවත්ත පහළ ඉරවල්ල නමැති දේපලට බලයලත් මිනින්දෝරු ඩී. එම්. ගමගේ මහතා විසින් 1989.12.31 දින මැන සාදන ලද අංක 599 දරන පිඹුරේ ලොට් අංක 07 දරන පර්චස් නවයයි දශම හතරයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 9.40) ක් විශාල ඉඩමට මායිම්, උතුරට : ලොට් 08 ද, නැගෙනහිරට : මල ඇල ද, දකුණට : ලොට් 06 ද, බස්නාහිරට : මහා මාර්ගය ද යන මායිම් තුළ ඇති ඉඩම සහ ඒ තුළ ඇති ගොඩනැගිලි, ගහකොල, පළතුරු ආදී සියළු දේද වේ.

මෙම දේපළ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ අංක S193/202 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකාර,

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලාය,
කෑගල්ල.
11-118

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.11.12 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් මන්සූර් මරික්කාර් මහතා විසින් සහතික කරන ලද 1995.07.19 දිනැති අංක 6416 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.09.15 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් හාරලක්ෂ පනස් දෙදහස් අටසිය අනූනවයයි ශත හතලිස් එකක (රු. 4,52,899.41) මුදලක් සමග රුපියල් තුන්ලක්ෂ අනූහය දහස් පන්සිය අසූඑකයි ශත අසූඑකක (රු. 3,96,581.81) මුදලක් මත වසරකට සියයට හත (7%) බැගින් පොළියක් ද, 2009.09.16 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ගාල්ල, බංගලාවත්ත, මොරිස් පාර, අංක 71/2 හි පදිංචි තෙලිකඩ ආචාරිගේ ඩාර්ලින් මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 6416 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් හාරලක්ෂ පනස් දෙදහස් අටසිය අනූනවයයි ශත හතලිස් එකක (රු. 4,52,899.41) මුදල සමග 2009.09.16 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මාතර, කොටුව, විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39හි පදිංචි වෙන්දේසිකාර පද්මානන්ද සිරිවර්ධන මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, ගාල්ල අධිශ්‍රේණී ශාඛාවේ, ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්ක මහ නගර සීමාවේ, දරකන්කානන්ගේවත්ත අද්දර ඕවිට සහ මාඉටිපේ කලින් ඇටගොයිපල හි ඇති සියළු දේ ද, මොරිස් පාර, අංක 71/2 වරිපනම් අංකය දරන නිවස සමග දෙල්ගහදූවේවත්ත හෙවත් දෙල්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. විසුම්පෙරුම විසින් සාදන ලද 1980.01.27 දිනැති අංක 400B දරන පිඹුරේ ලොට් 4C හි නිරූපිත, ලොට් 4C1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : (පාරට වෙන් කර ඇති කොටස ද) නැගෙනහිරට : ලොට් අංක 4B ද, දකුණට : දෙල්ගහදූව අද්දර ඕවිට සහ අඳගොඩ අද්දර ඕවිට සහ බස්නාහිරට : ලොට් 4C2 මායිම්ව එකී අංක 400B දරන පිඹුර ප්‍රකාර පර්චස් දාහතයි දශම හතයි පහක (අ. 0, රූ. 0, පර්. 17.75) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියලු දේ ද වේ. මෙය ගාල්ල දිස්ත්‍රිත් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A406/136 හි ලියාපදිංචි කොට ඇත.

ඩබ්. අයි. හෙට්ටිහේවා මිය,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
ගාල්ල අධිශ්‍රේණී ශාඛාව.
11-122

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.08.19 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් එම්. සී. ජයරාණි පීරිස් මහත්මිය විසින් සහතික කරන ලද 2007 ජනවාරි මස 09 දිනැති අංක 14636 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2010.07.11 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් පනස්අට ලක්ෂ හැත්තෑඑක් දහස් පන්සිය විසිහතයි ශත අනූදෙකක (රු. 58,71,527.92) මුදලක් සමග රුපියල් තිස්පන්ලක්ෂ පනස් දෙදහස් අටසිය විසිඑකයි ශත අනූතුනක (රු. 35,52,821.93) මුදලක් මත වසරකට සියයට දාසය (16%) බැගින් පොළියක් ද, 2010 ජූලි මස 12 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් බණ්ඩාරවෙල, රිවසයිඩ් ඉන් ඇල්ලෙතොට, අංක 114හි පදිංචි, උඩුව විදානලාගේ දොන් එඩ්වඩ් මහතා සහ ගඟහදවත්ත ආරච්චිගේ සූජීවා ශ්‍යාමලී පෙරේරා මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 14636 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් පනස්අට ලක්ෂ හැත්තෑඑක් දහස් පන්සිය විසිහතයි ශත අනූදෙකක (රු. 58,71,527.92) මුදල සමග 2010.07.12 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බදුල්ල, කලුගල්පිටිය, අංක 48හි පදිංචි වෙන්දේසිකාර ඩබ්. ජයතිලක මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, බණ්ඩාරවෙල ශාඛාවේ ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹල්වෙල කෝරළේ, රාවනාඇල්ල ග්‍රාමයෙහි (F. V. P. 280) පිහිටි "ඇරව්හේන" නමැති ඉඩමේ සීමා නිර්ණය කොට බෙදන ලද ඉඩම් කැබැල්ල එනම්, බලයලත් මිනින්දෝරු එම්. පී. ගුණරත්න විසින් සාදන ලද 2005.08.27 වැනි දිනැති අංක 2245 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස නිරූපිත ඉඩම් කැබැල්ල එකී පිඹුරට අනුව උතුරට : F. V. P. 280හි ලොට් 73 සහ මාලා කඳුර ද, නැගෙනහිරට : කිරිදිඔය ද, දකුණට : ඇටකැහැල ආර සහ ආර (වියළි) ද, බස්නාහිරට : ප්‍රධාන පාර ද මායිම්ව මෙම මායිම් තුළ අක්කර දොළහයි රූඩ් තුනයි පර්චස් තිස්දෙකයි දශම හතක (අ. 12, රූ. 3, පර්. 32.7) හෙවත් හෙක්ටයාර් පහයි දශම දෙකයි හතරයි දෙකක (හෙක්. 5.242) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති සියළු දේ ද වේ. මෙය J161/158 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්. එම්. එන්. ඩබ්. විරසිංහ
කළමනාකරු.

ලංකා බැංකුව,
බණ්ඩාරවෙල.
11-124

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.08.19 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් ඊ. කේ. එච්. එම්. කරුණාතිලක විසින් සහතික කරන ලද 2007.11.19 දිනැති අංක 654 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2010.06.22 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් හතලිස්හයලක්ෂ දාහතර දහස් තුන්සිය හැත්තෑඅටයි ශත හතලිස් තුනක (රු. 46,14,378.43) මුදලක් සමග රුපියල් තිස්නව ලක්ෂ විසිහතර දහස් හාරසිය හතලිස් හයයි ශත හැටහතරක (රු. 39,24,446.64) මුදලක් මත වසරකට සියයට දාසය (16%) බැගින් පොළියක් ද, 2010.06.23 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් හඳපාන්ගොඩ කොටිගල, කොළඹ පාරේ පදිංචි ලලිත් කොඩිප්පිලිආරච්චි මහතා සහ සුමාලි සාගරිකා වැලිකන්න මහත්මිය යන අයගෙන් එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. ඉහත කී බැඳුම්කර මත අයවිය යුතු ඉහත "1" හි සඳහන් මුදල සමග විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290හි පදිංචි ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (297 අධකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ. රයිගම් කෝරළේ, උඩුගහපත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා සීමාවේ (පෝරුවදණ්ඩ උප කාර්යාල) අරකාවිල සහ කොටිගල ග්‍රාමයේ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ එහි ඇති සියලු දේ ද සහිත, මැදගොඩැල්ලහේන සහ දඹිස්සඹිවිට නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඕ. සී. ප්‍රනාන්දුපුල්ලේ විසින් සාදන ලද 1994 ජූනි මස 16 වැනි දිනැති අංක 703 දරන පිඹුරේ ලොට් 1 ලෙස දක්වා බෙදා වෙන් කර ඇති ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් 1 උතුරට : පිඹුරු අංක 532හි ලොට් ඈ සහ ලොට් ච ද, නැගෙනහිරට : අංක 532 දරන පිඹුරේ ලොට් ඉ හි ඉතිරි කොටස ද, දකුණට : පන්සල් ඉඩම ද, බස්නාහිරට : එකී අංක 532 දරන පිඹුරේ ලොට් අ හි ඉතිරි කොටස සහ ලොට් ඈ ද, මායිම්ව එකී අංක 703 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් හතරයි දශම හයයි හතක (අ. 0, රූ. 1, පර්. 4.67) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E158/208 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඩී. ජයලත්,
කළමනාකරු.

ලංකා බැංකුව,
ඉංගිරිය ශාඛාව.
11-123

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : එස්-1/49669/ඒඕ1/119, එස්-1/53155/ඒඕ1/174.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2010.08.30 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. සී. කේ. නියතපාල විසින් සහතික කරන ලද 2006.06.02 සහ 2006.09.08 දින හා අංක 3027 සහ 3132 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, වැල්ලම්පිටිය පදිංචි කපිල එඩ්ගා විජේසේකර, ජයතිස්ස විජේසේකර, නන්දා විජේසේකර සහ මාතරගේ දිල්හානි කුමුදිනී පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.06.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දාහත්ලක්ෂ හතලිස් හතර දහස් එකසිය හැත්තෑ තුනයි ශත අනූතුන (රු. 17,44,173.93)ක් සහ හත් ලක්ෂ පන්දහස් දෙසීය විසිහත (රු. 7,05,227) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3027 සහ 3132 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් අටසිය හැත්තෑ දෙකයි ශත අට (රු. 872.08) සහ රුපියල් තුන්සිය විසිඅටයි ශත හතලිස්හය (රු. 328.46) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, අඹතලෙන් පහල කොලොන්නාව නගර සභා සීමාව තුළ මීතොටමුල්ල ග්‍රාමයේ පිහිටි මීතොටමුල්ල පාර, වරිපනම් අංක 60 දරන කහටගහවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු කේ. ඩී. වෝල්ටර් ද පෙරේරා විසින් සකසන ලද 2006.05.24 දිනැති හා අංක 103/2006 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 01 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 6.75ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ ඇතුළු සියලු දේත් සමග වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 913/259 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 ඔක්තෝබර් මස 20 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.
11-60/3

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 6/46043/එෆ්6/538, 6/48459/ඒ6/077.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2010.06.09 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. වීරසිංහ සහ එච්. එන්. එස්. හඳුන්නෙත්ති විසින් සහතික කරන ලද 2004.05.12 සහ 2005.09.14 දින හා අංක 3924 සහ 3329 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, පිළියන්දල පදිංචි ජයකොඩිගේ ගාමිණි ප්‍රේමවීර සහ වේලුසාමිගේ විජයලක්ෂ්මි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.03.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ විසිදෙදහස් පන්සිය තිහයි ශත දෙක (රු. 1,22,530.02) ක් සහ රුපියල් තුන්ලක්ෂ අනූනවදහස් හාරසිය අසූවයි ශත හැත්තෑ නවය (රු. 3,99,480.79) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3924 සහ 3329 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් පනස් හතයි ශත හත (රු. 57.07)ක් සහ රුපියල් එකසිය අනූනවයයි ශත හැත්තෑහතර (රු. 199.74) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, වාද්දුව, තල්පිටිය උතුර, මැද පාර, අංක 40හි බලයලත් වෙන්දේසිකාර ඩී. පී. එල්. සී. සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

**උපලේඛනය**

කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, අදිකාරි පත්තුවේ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ කිඳෙල්පිටිය පිහිටි බටදොඹගහවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු අයි. ටී. මාදොල විසින් සකසන ලද 2002.06.17 දිනැති හා අංක 2002/108 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 45 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 129/262 යටතේ ලියාපදිංචි කර ඇත.

තවද එකී අංක 2002/108 පිඹුරේ කැබලි අංක බී2 මතින් සහ අනෙකුත් වෙන්කළ පාරවල් සඳහා ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 ඔක්තෝබර් මස 20 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.
11-60/4

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : එස්-6/45808/ආර්ඩී1/236, එස්-6/46946/ආර්ඩී1/243.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.24 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

